| 18 | අවන්තිදේවී ළමා නිවාසයේ රාත්‍රී කාලයේ උත්සවයක් පැවැත්වීම හා එහිදී පිරිමි ,නිලධාරීන් මත්පැන් පානය කිරීම දැරියක මෙහෙකාර සේවයේ යෙදවීම ආදී කරුණු සම්බන්ධයෙන් හිටපු පරිවාස කොමසාරිස්වරයෙකු හා ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරිණියක අත්අඩංගුවට ගෙන ඇප මත නිදහස් කිරීම සම්බන්ධයෙන් එහි වර්ථමාන තත්ත්වය පිළිබඳ සොයා බැලීම. | ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරිණිය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂනය සඳහා කමිටුවක් පත් කර ඇත.<br>සභාපති - ඩබ්.එම්.ගයාන් ඉන්දික මහතා, පලාත් ක්‍රීඩා අධ්‍යක්ෂ<br>සාමාජික - එස්.ඒ.ගුණසේකර මෙය, පරිපාලන නිලධාරී, තඹුත්තේගම රෝහල<br>සාමාජික- ඒ.කේ.සී.කේ.රත්නසේකර මයා. සංවර්ධන නිලධාරී, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය<br>• මෙම නිලධාරිණිය සම්බන්ධව අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව නීතිපති උපදෙස් ලැබෙන තෙක් 2026.03.09 දින දක්වා කල් තබා ඇත.<br>පළාත් පරිවාස කොමසාරිස් සම්බන්ධයෙන් පළාත් සෞඛ්‍ය | කමිටු වාර්තාව සති දෙකකින් ලබා දෙන බව කමිටු සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරිණිය සම්බන්ධයෙන් වන නඩුව නැවත 2026.06.06 දිනට කැදවා ඇත.<br><br>කමිටු වාර්තාව සති 03 කින් ලබා දෙන බව කමිටු සභාපති ප්‍රකාශ කරන ලදී. . | | පළාත් පරිවාස කොමසාරිස් | 06 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | අමාත්‍යාංශය මගින් පරීක්ෂණයක් සිදු කර ඇත. චෝදනා පත්‍ර නිකුත් කිරීමට තරම් කරුණු අනාවරණය නොවන බව වාර්තා කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) විසින් දන්වන ලදී. | | | | |
| | **පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව** | | | | | |
| 19 | ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අංක NCP/IA/03/SS/19//25-67 හා 2025.08.19 දින නිකුත් කරන ලද විගණන වාර්තාව සඳහා පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් අංක NCP/SS/F1/34 (II) හා 2025.11.21 දිනැති ලිපිය මගින් පිළිතුරු සපයා ඇති අතර එහිදී පෙන්වා දුන් දෝශ නිවැරදි කර ඇති බව දන්වා ඇතත් 2025.12.15 දින සිදු කරන ලද පසුවිපරම් පරීක්ෂාව අනුව වාර්තාවෙහි 6.1 (අ) ඡේදය හා 6.1 (ඇ) ඡේදය මගින් දක්වා ඇති දෝෂයන් තවදුරටත් පවතින බව දෘෂ්‍යාමාන විය. | අතරුදවුම් මුදල් මෙතෙක් නිදහස් කර නොමැති බැවින් අතරුදවුම් මුදල් මගින් අඩුපාඩු නිවැරදි කර ගත හැකි බව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී.<br>මෙවැනි තත්වයන් ඉදිරියේදී ඇති නොවන පරිදි කටයුතු කිරීමට තාක්ෂණ අංශ අවධානය යොමු කල යුතු බව දන්වන ලදී. | තාක්ෂණ කමිටුවක් පත් කර සති දෙකක් ඇතුලත වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා ඇති බව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ (වැ.බ.) විසින් ප්‍රකාශ කරන ලදී.<br>කමිටු වාර්තාව ලබා දී නැත.<br>දෝශ මෙතෙක් නිවැරදි කර නැත. මෙතෙක් අත රුදවුම් මුදල නිදහස් කර නැත. | අත රුදවුම් මුදල් භාවිතා කර නිවැරදි කිරීම් සිදු කරන ලෙසත් ප්‍රගතිය විමසීම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ විගණන හා කළමණාකරන කමිටුවට යොමු කිරීමටත් තීරණය විය. | පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ , සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්/ නි.ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් | 04 |

<table>
<tr><td></td><td colspan="5">පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>20</td><td colspan="2">සමුපකාර සමිතිවල ගිණුම් තැබීමේ දෝෂ පැවතීම හා විගණනයන් ප්‍රමාද කිරීම .<br>2026.03.06 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ සහ විගණන නිම කිරීමේ ප්‍රගතිය -<br>
<table>
<tr><th>අනු අංකය</th><th>විවිධ සේවා සමුපකාර සමිතිය</th><th>අවසන් වරට මූල්‍ය ප්‍රකාශන ලද මුදල් වර්ෂය</th><th>මූල්‍ය ප්‍රකාශය ලැබිය යුතු මුදල් වර්ෂය</th><th>අවසන් වරට විගණනය කල මුදල් වර්ෂය</th></tr>
<tr><td>1</td><td>සී/ස ඇලහැර විවිධ සේවා සමු. සමිතිය</td><td>2025.12.31</td><td>-</td><td>2022.12.31</td></tr>
<tr><td>8</td><td>සී/ස මැදිරිගිරිය විවිධ සේවා සමු. සමිතිය</td><td>2025.12.31</td><td>-</td><td>2020.12.31</td></tr>
<tr><td>9</td><td>සී/ස කවුඩුල්ල විවිධ සේවා සමු .සමිතිය</td><td>2020.12.31</td><td>2021.01.01 – 2025.12.31</td><td>2019.12.31</td></tr>
</table></td><td>කවුඩුල්ල සමුපකාර සමිතියේ හැර අනෙත් ආයතන දෙකෙහි මූල්‍ය ප්‍රකාශ හා විගණනය සම්බන්ධ ප්‍රගතිය පළාත් සමුපකාර අමාත්‍යාංශ විගණන කමිටුවට යොමු කිරීමට තීරණය විය</td><td>පළාත් සමු.සං.කොම සාරිස්/ලේකම්, පළාත් සමුපකාර අමාත්‍යාංශය</td><td>09</td></tr>
<tr><td>21</td><td>වීරපුර සණස සමිතියේ මූල්‍ය වංචාව<br>කළමණාකරු සහ සහය කළමණාකරු විසින් 2014 සිට 2020 වර්ෂය දක්වා සිදු කරන ලද රුපියල් මිලියන 49 ක මූල්‍ය වංචාව සිදුවන කාලයේ නිලධාරීන් 09 දෙනෙකු සේවය කර ඇති අතර ඔවුන්ගෙන් 05 දෙනෙකු මේ වන විට රාජකාරියේ යෙදී සිටින බවත් එයින් එක් අයෙකු මෑතකදී</td><td colspan="2">සී/ස වීරපුර ස.ණ.ස.සමිතියේ 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සිදුව ඇති මූල්‍ය වංචාව රු.49,927,001.75 කි. 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සිදුකරන ලද දෙපාර්තමේන්තු විගණනයේදී මෙම තත්ත්වයන් අනාවරණය කරගෙන ඇත. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.<br>
<table>
<tr><th>වර්ෂය</th><th>මූල්‍ය වංචාව (රු.)</th><th>අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග</th></tr>
<tr><td>2014</td><td>5,558,700.28</td><td>පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණයේදී උසාවි නඩු අංක 72513 යටතේ 2025.06.26 දින සම්පූර්ණ මුදලම එකවර ගෙවන ලෙසට තීන්දුව ලබාදී ඇත.</td></tr>
</table></td><td>පළාත් සමු.සං.කොම සාරිස්/ලේකම්, පළාත් සමුපකාර අමාත්‍යාංශය</td><td>10</td></tr>
</table>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | විශ්‍රාම යාමට නියමිතව සිටින අතර එම නිලධාරිණිය පොළොන්නරුව දිස්ත්‍රික් සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරන බවත් එම නිලධාරින් 05 දෙනාගෙන් නිදහසට කරුණු විමසීමේ දී ඔවුන් විසින් ඉදිරිපත් කල කරුණු පිළිගත නොහැකි බැවින් මූලික විමර්ශනයක් සිදු කල යුතු බවත් සමුපකාර කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | | | වගඋත්තරකරුවන් බන්ධනාගාරගත කර ඇත. මාස 06 ක සිරදඬුවම් නියම වී ඇත. | | | |
| | | 2015 | 6,599,806.77 | එස්/432/පො යටතේ තීරකවරයා ලෙස එස්.ජේ.රාජපක්ෂ මයා පත්කර ඇත.<br>විභාග කටයුතු අවසන් වී ඇත. ප්‍රදානය ලබාදීමට තිබේ. | | | |
| | | 2016 | 6,647,378.00 | උසාවි නඩු අංක 72514 යටතේ 2025.06.26 දින පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණයේදී සම්පූර්ණ මුදලම එකවර ගෙවන ලෙසට තීන්දුව ලබාදී ඇත.<br>අදාල මුදල නොගෙවුහොත් මාස 06 ක සිරදඬුවම් නියම කර ඇත. වගඋත්තරකරුවන් දෙදෙනා මේ වනවිට බන්ධනාගාර ගත කර ඇත. | | | |
| | | 2017<br>2018 | 14,582,966.99 | S/459/පො යටතේ තීරකවරයා ලෙස ආර්.එම්.පී.ඒ.කේ.රාජකරුණා මිය පත්කර ඇත.විභාග කටයුතු සිදුකරමින් පවතී. (2017 වර්ෂයේ මූල්‍ය වංචාව රු.500,000.00 කි.<br>S/459/පො යටතේ තීරකවරයා ලෙස පී.ජී.කේ.ෆොන්සේකා මයා පත්කර ඇත. විභාගකටයුතු සිදුකරමින් පවතී.)<br>බන්ධනාගාර අධිකාරිය හා සම්බන්ධ වී ඉදිරි කටයුතු සිදු කරන ලෙස තීරකවරයා දැනුවත් කර ඇත. | | | |
| | | 2019<br>2020 | 15,717,062.10 | S/466/පො යටතේ තීරකවරයා ලෙස ඩී.එන්.කොඩිතුවක්කු මයා පත්කර ඇත. විභාග කටයුතු අවසන් කර ඇත. ප්‍රදානය ලබාදීමට තිබේ. | | | |
| | | 2021 | 587,577.95 | විගණනයෙන් පසු මුදල් වංචාව අනාවරණය කරගෙන ඇත. තීරකකරණයට යොමු කර මුදල් අයකර ගැනීම සිදුකල යුතුව ඇත. එන්තරවාසි නිකුත් කිරීම සිදුකර ඇත. | | | |
| | | | | • එවකට පොළොන්නරුව සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කල පී.ඊ.එම්.ආර්.පී.පලිපාන මිය වයස අවුරුදු 60 සම්පූර්ණවීම මත, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 12 වගන්තිය යටතේ 2024.08.13 | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | දින විශ්‍රාම ගන්වා තිබූ අතර, මූලික විමර්ශන වාර්තාව අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 17 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා ඇත.<br>• මූලික විමර්ශන වාර්තාව මගින් අධීක්ෂණ දුර්වලතා අනාවරණය කර ඇති බවත්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවත් පළාත් සමූපකාර කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | | | | |
| 22 | සී/ස අනුරාධපුර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිතිය සඳහා මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා ආහාර දෙපාර්තමේන්තුව මගින් රු.මිලියන 43 ක මුදලක් වී මිලදී ගැනීම සඳහා ලබා දී ඇතත් එකී සමිති විසින් ගිවිසුම් ප්‍රකාරව නියමිත කාල වලදී එම මුදල් පියවා නොමැති වීම හේතුවෙන් රු.මිලියන 27.65 ක ණය මුදලක් හිග ණය ලෙස පවතී. | • ගිවිසුමේ කොන්දේසි අනුව නීත්‍යානුකූල කටයුතු කිරීම සඳහා නීති අංශයේ උපදෙස් ලැබී ඇත. | මෙම රු.මි. 27.65 ක හිඟ ණය මුදලට අදාලව රු.650,000.00 ක මුදලක් අදාල සමිතිය විසින් 2025.03.06 දින ගෙවා ඇත. රු.මි. 27 ක ණය මුදලක් තවදුරටත් හිඟ ණය මුදල් ලෙස පවතී. සමිතිය අක්‍රිය මට්ටමේ පවතී.<br>• ගිවිසුම අනුව පොදු දේපල පනත යටතේ නඩු පැවරීම සඳහා නීති අංශය මගින් නීති උපදෙස් ලබා දී ඇත. | | ලේකම් , පළාත් සමූපකාර අමාත්‍යාංශය පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් | 07 |
| **පළාත් පාලන අමාත්‍යාංශය** | | | | | | |
| **<u>පළාත් පාලන දෙපාර්තමේන්තුව</u>** | | | | | | |
| 23 | පොළොන්නරුව සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට අනුයුක්ත අංක NCKJ 3509 දරණ රථය 2020 අගෝස්තු 27 වන දින අනතුරකට ලක්වීම සහ මේ දක්වා අළුත්වැඩියා නොකිරිම. | යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය මත අළුත්වැඩියාව අවසන් කර ඇත. රක්ෂණ සමාගම මගින් රු.1,325,907.00 ක් ගෙවා ඇත. රක්ෂණ සමාගමෙන් බිල්පත සඳහා ගෙවා ඇතත් 2020 සිට මේ දක්වා | නිලධාරීන්ගෙන් අයකිරීම ප්‍රගතිය -2026.05.31 දිනට<br>H.M.වින්ද්‍යා ප්‍රසාදිනී හේරත් මිය - ස.ප.පා.කොමසාරිස් (අයකල යුතු මුදල රු.466,800.00 ) 2026.05.31 දිනට අයකල මුදල රු. 210,060.00(7780.00*27) | අළුත්වැඩියාව අවසන් කර වාහනය ධාවනයට යොදවන ලෙස දන්වන ලදී. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්/පළාත් පාලන කොමසාරිස් | 13 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | මු.රෙ. 104(ප.මූ.රී.54) වාර්තාව අනුව රක්ෂණ සමාගමෙන් අය නොවන කොටසෙන් සියයට 60ක් නිලධාරියාගෙන් සහ සියයට 40ක් රියදුරුගෙන් අයකළ යුතු බවට නිර්දේශ කර ඇත. එය මේ වන විට අය වෙමින් පවතී. | රථය ධාවනයට යොදා ගැනීමට නොහැකිවීම හේතුවෙන් සිදු වී ඇති හානිය නිසාත්, නීත්‍යානුකූල නොවන ධාවනයකදී අනතුර සිදු වී ඇති නිසාත් නිලධාරීන්ගෙන් අයකිරීම නතර කිරීමට එකග නොවන බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.<br>නීත්‍යානුකූල නොවන ධාවනයකදී අනතුර සිදු වී ඇත්නම් ඒ සඳහා වගකිව යුතු නිලධාරීන්ට විනයානුකූල කටයුතු සිදුවිය යුතු බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී. | චාමර සුරංග මයා - රියදුරු (අයකල යුතු මුදල . රු.311,200.00) 2026.05.31 දිනට අයකල මුදල රු.145,226.48(5186.66*28)<br>රථයේ අනතුරට අදාල අලුත්වැඩියාව අවසන් කර කාර්යාලය වෙත ගෙනැවිත් ඇත. එහෙත් ධාවනයේ නොයෙදවීම හේතුවෙන් ඇතිවී තිබෙන දෝශ අළුත්වැඩියාව සදහා ඇස්තමේන්තුවක් ලබා ගෙන ඇති බව පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | | | |
| 24 | 2014 වර්ෂයේ අනුරාධපුර මහ නගර සභාවේ රු. මිලියන 40 මුදල් වංචාව. | • මෙම මුදල් පළාත් සභා අරමුදලින් දරණ ලද වියදම් වන බැවින් මු .රෙ. 104 (ප.මූ.රී.54) පරීක්ෂණය පළාත් ප්‍රධාන | • මු .රෙ. 104 (ප.මූ.රී.54) පරීක්ෂණය සදහා කමිටුවක් පත් කර නැත.<br>• රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ විමර්ශන වාර්තාව මෙතෙක් ලබා දී නැත. | මු .රෙ. 104 (ප.මූ.රී.54) පරීක්ෂණය සදහා කඩිනමින් කමිටුවක් පත් කරන ලෙස දන්වන ලදී. | ප්‍රධාන අමාත්‍යංශ ලේකම්/පළාත් පාලන කොමසාරිස්/නා | 09 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කල යුතු බව දන්වන ලදී.<br>• අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සිදු කරන පරීක්ෂණය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් සිදු කරන පරීක්ෂණය හා මු.රෙ.104(ප.මූ.රී.54) පරීක්ෂණය යනු කාරණා තුනක් බවත් මෙම පරීක්ෂණ තුනම වෙන වෙනම ස්වාධීනව සිදු විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. | | | ගරික කොමසාරිස් | |
| 25 | පොළොන්නරුව මහ නගර සභාව විසින් ඉදිකරන ලද කදුරුවෙල නව වෙළෙඳ සංකීර්ණය<br>• වෙළඳ සංකීරණය වසර 30 ක කාලයක් සඳහා තනි පුද්ගලයෙකුට බදු දීම<br>• ලබාගත යුතු එක්වන් මුදල රු. මිලියන 5 සිට රු. මිලියන 3 දක්වා අඩු කර ලබා ගැනීම | පරීක්ෂණ වාර්තාව ලබා දී ඇත. පරීක්ෂණ කමිටු නිර්දේශ නොපමාව ක්‍රියාත්මක කරන ලෙස දන්වන ලදී.<br>පරීක්ෂණ වාර්තාව නව අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙසත්, නව අමාත්‍යාංශය මගින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් දන්වන ලදී. | පරීක්ෂණ වාර්තාව නව අමාත්‍යාංශය වෙත 2026.03.14 දින යොමු කර ඇත. | පරීක්ෂණ වාර්තාව අනුව කටයුතු කරන ලෙස දන්වන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය | 08 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | • බදුකරුගෙන් ලබාගත් එක්වන් මුදලෙන් 50% ක් ගොඩනැගිල්ල ඉදිකල කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම.<br>• මාසික කුලී අය කර නොගැනීම.<br>ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තාව පදනම් කරගෙන මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/AD/09/01/PO/2025(01) හා 2025.04.22 දිනැති ලිපිය මගින් අධ්‍යක්ෂ(පුහුණු) ජේ.රලියුදීන් මහතා පත් කර ඇත. | | | | | |
| 26 | **<u>අනුරාධපුර මහා නගර සභාව</u>**<br>1. අනුරාධපුර මහා නගර සභාවට අයත් බැංකු පෙදෙස අංක 07 දරණ නිල නිවස සමූපකාර රෝහල සඳහා ලබාදීම වෙනුවෙන් 2022 අගෝස්තු 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.6,719,842 කි. ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට 2022 නොවැම්බර් 04 දින එවකට වැඩබලන නගරාධිපති එම්.ඩබ්. | 1. අය කිරීම් ප්‍රගතිය නිශ්චිතව දැක්විය යුතු බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී.<br>2. මෙම හුවමාරුව සම්බන්ධයෙන් සභා තීරණයක් ගන්නා ලෙසත් ඉඩම් දෙකෙහි වටිනාකම් පිළිබඳව හා කුලිය පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුව | 1. අනුරාධපුර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලද්දේ අනුරාධපුර මහා නගර සභාවට අයත් බැංකු පෙදෙස අංක 07 දරණ නිල නිවස සමූපකාර රෝහල සඳහා ලබාදීම වෙනුවෙන් අනුරාධපුර මාකට් පෙදෙසේ පිහිටි සමූපකාර සංවර්ධන කොමසාරිස් සතු ඉඩමක් හුවමාරු කර ගැනීමට යෝජනා වී සාකච්ඡා කර ඇති බව ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව සමූපකාර සංවර්ධන | මෙම කරුණු අනුරාධපුර මහ නගර සභාවේ විගණන කමිටුවේදී සාකච්ඡා කිරීම සුදුසු බවත් ඒ අනුව මෙම කමිටුවෙන් ඉවත් කිරීමටත් තීරණය විය. | ලේකම්, පළාත් පා. අමා./<br>ලේකම්, පළාත් සමූ. අමා./<br>පළාත් පාලන කොමසාරිස්/නාගරික කොම./<br>ප.සමූ.කොම. | 05 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | බුද්ධික ප්‍රේමදාස මහතා විසින් පිළිතුරු ලබාදී ඇති නමුත් ඒ සම්බන්ධව ඉන්පසු කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබීම.<br><br>2. මාර්කට් පෙදෙස කඩ කාමර 13 කට අදාළව අයවිය යුතු හිඟ ශේෂය රු.4,846,526 කි. එයින් කඩ අංක 43 ට අදාළව හිඟ මුදල වන රු.2,001,695 ක් වසර 10 කට ආසන්න කාලයක් තුළ ගෙවා නොතිබීම(ඩී.එස්.එස්.සුමිත්‍රාරච්චි මහතා විසින් එම කඩය පවත්වාගෙන යනු ලබයි)<br>3. මහා නගර සභාවේ අභ්‍යන්තර විගණනය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකර නොතිබීම. | මගින් තක්සේරුවක් ලබා ගත යුතු බවද දන්වන ලදී.<br>3. මීලග විගණන කමිටුවට පෙර තීරණයක් ගෙන ඒ පිළිබඳ ප්‍රගතිය මීලග විගණන කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. අදාල අමාත්‍යාංශ දෙකෙහි ලේකම්වරුන්ට මේ සම්බන්ධයෙන් මැදිහත්වන ලෙස ද දන්වන ලදී.<br>4. මහා නගර සභාවේ අභ්‍යන්තර විගණනය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් මගින් සිදු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කල යුතු බව දන්වන ලදී.<br>• විගණනයට තොරතුරු ලබාදීම සඳහා අංශ අනුව බලය පවරා තොරතුරු කඩිනමින් ලබා දිය යුතු බව දන්වන ලදී. | කොමසාරිස් විසින්ද කරුණු දක්වමින් තහවුරු කරන ලදී.<br>2. හිග කඩකුලී අයකර ගැනීමට කටයුතු කර ඇති බවත්, මේ වන විට හිග මුදලින් 60%, 70% ක් පමණ අයකර ගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදී.<br>3.මහා නගර සභාවේ අභ්‍යන්තර විගණනය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කල යුතු බවට අදහස් කරන ලද්දේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් විසින් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කල යුතු බව යන්න ජ්‍යේෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ඉදිරියේදී කටයුතු කරන බව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.<br>4.මහා නගර සභාවේ තොරතුරු ලබා ගැනීමේදී ඊට යම් බාධා පැවතීම සම්බන්ධයෙන් ජ්‍යේෂ්ඨ සහකාර විගණකාධිපති විසින් පැහැදිලි කල අතර, දෛනික ධාවන සටහන් විගණනය වෙත නොලැබීම පිළිබඳ ප්‍රකාශ කරමින් මහ නගර සභාවේ වාහන සඳහා ඉන්ධන නිකුත් කිරීමද | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 7 (1) කොටස මඟින් ලබාදී ඇති බලතල ප්‍රකාරව විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරිය ලත් ඕනෑම තැනැත්තෙකුට විගණිත ආයතනයේ පොත්පත්, වාර්තා, ලේඛන ලබාදීමට සහ ඕනෑම තැනැත්තෙකුගෙන් ලිඛිත හෝ වාචිත ප්‍රකාශ ලබා ගැනීමට හැකි නමුත් අනුරාධපුර මහා නගර සභාවේ තොරතුරු ලබා ගැනීමේදී ඊට යම් බාධා පැවතීම.<br><br>5. මහ නගර සභාවට අයත් වාහනවල ධාවන සටහන් කිසිවක් ඉදිරිපත් කර නොමැතිවීම. | | ගැටළු සහගත බව දන්වන ලදී. එසේම තොරතුරු ලබා දීමේ ප්‍රමාදය තවදුරටත් පවතින බව ද ප්‍රකාශ කරන ලදී. මෙහිදී නාගරික කොමසාරිස් විසින් වාහනවලට ඉන්ධන නිකුත් කිරීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දුන් බවත්, ඒ අනුව මහ නගර සභාවේ වාහනයකට ඉන්ධන ලබා ගැනීමේදී එම සභාවේ නිලධාරියෙකු හා විගණන නිලධාරියෙකු අතර ඇති වූ ගැටළුමයකාරී තත්වයක් වාර්තා වූ බවත්, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර විගණනයට අවශ්‍ය තොරතුරු නොපමාව ලබා දෙන ක්‍රමවේදයක් සකස් කරන බවත් ප්‍රකාශ කරන ලදී. එසේම විගණනය විසින් තොරතුරු ඉල්ලීමේදී නාගරික කොමසාරිස් දැනුවත් කරන ලෙසද විගණනයෙන් ඉල්ලා සිටින ලදී. | | | |
| 27 | 01. අනුරාධපුර මහා නගර සභාවේ නීති නිලධාරි ඩී.එන්.ප්‍රියන්ති මිය පළාත් පාලන කොමසාරිස් විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුවට ස්ථානමාරු කර ඇති අතර ඊට අනුකූලව කටයුතු | 1. මූලික විමර්ශනයේ නිර්දේශ ලබා දෙන තෙක් වැටුප් ගෙවිය යුතු බව ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | මහ නගර සභාව සඳහා නීති නිලධාරිගේ සේවය ලබා ගන්නා බැවින් මහ නගර සභාව මගින් වැටුප් ගෙවන බවත්, එය පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපූරණය නොකරන බවත් නාගරික කොමසාරිස් විසින් දන්වන ලදී. එසේම නීති නිලධාරී ස්ථාන මාරු කිරීමට හේතුව | මෙම කරුණ ද අනුරාධපුර මහ නගර සභාවේ විගණන කමිටුවේදී සාකච්ඡා කිරීම සුදුසු බවත් ඒ අනුව මෙම කමිටුවෙන් ඉවත් කිරීමටත් තීරණය විය. | ලේකම්, පළාත් පා. අමා./පළාත් පාලන කොමසාරිස්,/ නාගරික කොම.අ/පුර, පො/නරුව | 04 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | නොකිරීම නිසා පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන වැටුප් ප්‍රතිපූරණය නතර කර ඇත. මූලික පරීක්ෂණයක් සිදුනොකර ස්ථානමාරු කිරීම නිසා නීති නිලධාරි විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම නිසා නගර සභා අරමුදලින් වැටුප් ගෙවීමට සභා අනුමැතියක් ලබාගෙන වැටුප් ගෙවනු ලබයි.<br>02. ගිනි තබා විනාශ කිරීමට ලක්වූ කිරික්කුලම පිළිසරු ව්‍යාපෘතිය සඳහා යොදවා තිබූ අංක PD - 120 එක්ස්කැවේටර් යන්ත්‍රය සම්බන්ධ මූලික විමර්ශන වාර්තාව අනුව නාගරික කොමසාරිස්, ඉංජිනේරු, ගණකාධිකාරි, පරිපාලන නිලධාරි සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක යන නිලධාරීන්ගෙන් සමානුපාතිකව අයකළ යුතු බවට තීරණය කර ඇත. යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ තක්සේරු වාර්තාව අනුව සිදුවී ඇති අලාභය වන රු.මිලියන 3.3 න් ¼ ක | පොළොන්නරුව මහ නගර සභාවේ නීති නිලධාරී සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වන ලදී.<br>2. ගිනි තබා විනාශ කිරීමට ලක්වූ අංක PD - 120 එක්ස්කැවේටර් යන්ත්‍රය සම්බන්ධයෙන් වගකිව යුතු බවට නිර්දේශ කර ඇති නිලධාරීන් දැනට සේවය කරන ආයතනවල ආයතන ප්‍රධානීන් වෙත දන්වා වැටුපෙන් අය කර ගැනීම් සිදු කරන ලෙස දන්වන ලදී.<br>වාරික වශයෙන් ගෙවීම් කිරීමට නිලධාරීන් කර ඇති ඉල්ලීම ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | සඳහන් නොවන බැවින් නිදහස් කිරීම සිදු නොකර ඇති බවද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන ඒකකය මගින් සිදු කරන ලද විමර්ශනයක ප්‍රතිඵලයක් ලෙස මෙම ස්ථාන මාරුව ලබා දී ඇති බවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූරණය අත්හිටුවා ඇති බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. එසේම මේ සමබන්ධයෙන් නඩුවක් පවතින බවත්, පරීක්ෂණයක ප්‍රතිපලයක් ලෙස ස්ථාන මාරුව ලබා දී ඇති බව අධිකරණයට වාර්තා වී නැති බවත් ඇය විසින් ප්‍රකාශ කල අතර, එම නීති නිලධාරිණියට හිටපු ප්‍රධාන ලේකම්වරයෙකු විසින් private practice කිරීමට (පෞද්ගලික නීති සේවයේයෙදීමට) අවසර ලබා දී ඇති බවත්, ඊට අදාලව රජයට 25% ක් ගෙවිය යුතු බව දක්වා ඇතත් එම මුදල ඇය විසින් නොගෙවීමද මෙම ස්ථාන මාරුව ලබා දීමට එක් හේතුවක් වන නමුත් එම කරුණු අධිකරණයට වාර්තා වී නැති බව ද ඇය විසින් ප්‍රකාශ කරන ලදී. මෙහිදී ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති අංශයේ නීති නිලධාරී විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම නඩුවේ මූලික | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වටිනාකමක් වූ රු.825,000 ක් සමානුපාතිකව එක් අයෙකුගෙන් රු.165,000 බැගින් අයකිරීමට තීරණය කර ඇත. 2025 ඔක්තෝබර් 31 දින එක් එක් නිලධාරීන්ට ලිපි යවා ඇති අතර මේ වන තෙක් අලාභය අයකිරීම පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | | විරෝධතා විමසීම දැනට සිදු වෙමින් පවතින බවත්, අධිකරණය විසින් වැටුප් ප්‍රතිපූරණය නොකිරීම වරදක් බව සඳහන් කරන බවය.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුල නීති නිලධාරී තනතුරක් නොමැති වුවත් පොළොන්නරුව මහ නගර සභාවේ නීති නිලධාරී සතියට දින කිහිපයක් පලාත් පාලන දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, ඇය විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී ලෙස රබර් මුද්‍රාවක් ද භාවිතා කරන බවත් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කල අතර, මෙයද ඉදිරියේදී ගැටළුවක් විය හැකි බව සඳහන් කරන ලදී.<br>ගිනි තබා විනාශ කිරීමට ලක්වූ අංක PD - 120 එක්ස්කැවේටර් යන්ත්‍රය සම්බන්ධ මූලික විමර්ශන වාර්තාව අනුව අදාල නිලධාරීන්ට ගෙවීම් කරන ලෙස දන්වා ඇතත් මෙතෙක් ගෙවා නොමැති බවත්, එක් අයෙකු පමණක් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත්, නගර සභාවේ සේවය කරන අයගේ වැටුපෙන් අය කිරීම් සිදු කරන බවත් නාගරික කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සිය** | | | | | |
| 28 | <u>**අත්තිකාරම් නොපියවීම**</u><br>උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් සං: නි: හා යන්: ඒජ: වෙත වැව් 63ක් ප්‍රතිසංස්කරණය කිරීමට අදාලව රු. 69,731,617.29 ක අත්තිකාරම් මුදලක් නිකුත් කොට තිබුණි. එකී අත්තිකාරම් මුදලින් රු 38,481,079.29 ක් ප්‍රධාන අමාත්‍යාංශය වෙත පියවීම් කොට ඇති බවත් 2020 වර්ෂයේදී පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගන්නා ලද රු 4,844,676.00 ක් පියවා ගැනීමෙන් අනතුරුව ප්‍රධාන අමාත්‍යාංශය වෙත තව දුරටත් රු 26,405,862.00 ක මුදලක් නොපියවන ලද අත්තිකාරම් ලෙස පවතී.<br><br>මාසයකට රු.100,000.00 බැගින් ප්‍රධාන අමාත්‍යාංශය වෙත ගෙවීමට 2025.06.06 දින සිට ආරම්භ කරන බව ඒජන්සියේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී. මිලියන 26 ක මුදලින් මසකට රු.100,000.00 ක් බැගින් ගෙවීම ප්‍රමාණවත් නොවන බව | I. මේ සම්බන්ධයෙන් අධිකරණමය ක්‍රියාමාර්ගයකට යා යුතු බව කමිටුව විසින් තීරණය කරන ලදී. (ලිපිගොනු අතුරුදන්වීම සම්බන්ධයෙන් පළමු ක්‍රියාමාර්ගය ගැනීම)<br>සභාපති තුමා විසින් ප්‍රකාශ කරන ප්‍රගති වාර්තාව මෙම ව්‍යාපෘතිය අවසන්වීමට මාස දෙකකට පමණ පෙර තිබූ ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තාවක් බවත් එහි කිසිම ස්ථානයක ප්‍රමාණපත්‍ර අනුව ප්‍රගතියක් ඇතුලත්ව නැති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) විසින් ප්‍රකාශ කල අතර, මෙය නැවත විමර්ශනයක් සඳහා යොමු කල යුතු බව ද ප්‍රකාශ කරන ලදී.<br><br>මේ සම්බන්ධයෙන් විසඳුමක් ලැබෙන තෙක් දැනට මාසිකව ගෙවනු ලබන රු.100,000.00 ක | 2026.03.09 දින පැවති උතුරු මැද පළාත් සභාවේ 2026 පළමු වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සියේ සභාපති විසින් ප්‍රකාශ කරන ලද්දේ පසුගිය දිනවල එම ආයතනයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණි බවත් එහි ප්‍රතිඵලයක් ලෙස හමුවූ DECMA ආයතනයට අයත් ලිපිගොණුවක් පරීක්ෂා කිරීමේදී එහි ඇතුලත්ව තිබූ ප්‍රගති වාර්තාවක් හමුවූ බවත් එය ප්‍රධාන අමාත්‍යාංශය මගින් සකස් කරන ලද්දක් බවත්, එම වාර්තාව අනුව DECMA ආයතනය විසින් ප්‍රධාන අමාත්‍යාංශයට නොව ප්‍රධාන අමාත්‍යාංශය මගින් DECMA ආයතනය වෙත මිලියන 28 ක මුදලක් ගෙවීම් කල යුතුව ඇති බවත් දීර්ඝ ලෙස කරුණු පැහැදිලි කරමින් ප්‍රකාශ කරන ලද අතර, මෙයට අදාලව අවසන් ගිණුම් සකස් කර නොමැති බැවින් මෙම ප්‍රගති වාර්තාව පදනම් කරගෙන අවසන් ගිණුමක්ද සකස් කල බවත් ප්‍රකාශ කරන ලදී. එබැවින් DECMA ආයතනය විසින් දැනට ගෙවීම් කරන මුදල නවතා දැමීමට අනුමැතියක් ලබා දෙන | තෙවන පාර්ශවයක් වෙත යොමු කර තීරණයක් ලබා ගැනීම සුදුසු බව කමිටුව විසින් තීරණය කරන ලදී. අත්තිකාරම් ලබා දී ඇත්තේ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් වන බැවින් එම ආයතනය මගින් ඒ සඳහා කටයුතු කිරීම සුදුසු බව ද දන්වන ලදී. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්/ සභාපති,සං.නි. හා යන්.ඒජන්සිය | 14 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | කමිටුව විසින් ප්‍රකාශ කල අතර, ආයතනයේ පවතින මූල්‍ය අර්බුදය හමුවේ එයට වැඩි මුදලක් ගෙවීමට හැකියාව නොමැති බව එම ආයතනයේ සභාපති විසින් ප්‍රකාශ කරන ලද අතර, ඉදිරියේදී ආයතනය ශක්තිමත්වන ආකාරය අනුව වැඩි මුදලක් ගෙවීමට සළකා බලන බව ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>හිග අත්තිකාරම් මුදලින් 2026 පෙබරවාරි දක්වා ගෙවා ඇති මුදල රු.900,000.00. තවදුරටත් ගෙවිය යුතු මුදල - රු.21,905,862.00 | මුදල තවදුරටත් ගෙවන ලෙසත්, අවසන් ගිණුම ද සමග ප්‍රධාන අමාත්‍යාංශය මගින් පත් කරන කමිටුවක් මගින් පරීක්ෂණයක් සිදු කල යුතු බවත් තීරණය විය. | ලෙසත් මෙතෙක් ගෙවා ඇති මුදල ආපසු ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී. ඒ අනුව අවසන් ගිණුම ද සමග පරීක්ෂණයක් සිදු කිරීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් පහත කමිටුව පත්කර 2026.06.30 දිනට පෙර වාර්තාව ලබා දෙන ලෙස දන්වා ඇත.<br>සභාපති - ආර්.එම්.එම්.රත්නායක මහතා , ප්‍රධාන ගණකාධිකාරී,ප්‍රධාන අමාත්‍යාංශය<br>සාමාජික - බී.එච්.එම්.ටී.ඩබ්.බුලත්සිංහල මහතා, සැළසුම් අධ්‍යක්ෂ ,ප්‍රධාන අමාත්‍යාංශය<br>සාමාජික - ජී.ඩබ්.පී.එම්.ගලප්පත්ති මහතා, ඉංජිනේරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව<br><br>ප්‍රවර්ථන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියේ සභාපති විසින් ප්‍රකාශ කරන ලද්දේ මේ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා සමග සාකච්ඡාවක් පැවැත්වූ බවත්, මෙය 2010 වර්ෂයේ සිට පවතින අර්බුධයක් වන බැවින් මේ සඳහා තීරණයක් ගැනීමට CIDA වැනි තුන්වන පාර්ශවයකට යොමු කරන ලෙසත්ය. | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | මෙහිදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) විසින් ප්‍රකාශ කරන ලද්දේ  ගරු ආණ්ඩුකාරතුමා සමග පැවති සාකච්ජාවේදී භාණ්ඩාගාරයේ හා අමාත්‍යාංශයේ පොත්පත් අනුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය විසින් අත්තිකාරම් ලෙස තවදුරටත් මිලියන 25 ක් පියවීමට ඇති බව පෙන්වා දීමේදී සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියේ සභාපති විසින් එම කාලයේදී එම ඒජන්සිය විසින් මිලියන 93 ක පමණ වැඩ ඉටු කර ඇති බවත් තවදුරටත් මිලියන 29 ක පමණ ගෙවීම් ලබා ගැනීමට ඇති බව ප්‍රකාශ කල බවත් එය රැස්වීම් වාර්තාවක් පදනම් කර ගනිමින් ඔහු ප්‍රකාශ කරන බවත් දන්වන ලදී.  එම අවස්ථාවේදී ද එම සභාපති විසින් මේ සදහා ස්වාධීන පරීක්ෂණයක් සිදු කරන ලෙස ඉල්ලා සිටි බවත්, ඒ සදහා ගරු ආණ්ඩුකාරතුමා ද එකග වූ බවත් දන්වන ලදී.  නමුත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) විසින් ප්‍රකාශ කරන ලද්දේ ඔහුගේ පෞද්ගලික මතය වන්නේ මෙය ප්‍රමාණ පත්‍රයක් මත පදනම්වූ (BOQ)  බිල්පතක් නොව ප්‍රගති වාර්තාවක් පදනම් කර ගනිමින් | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | සභාපතිවරයා විසින් මෙම කරුණු ප්‍රකාශ කරන බවය. .<br>අමාත්‍යාංශය හා DECMA ආයතනය අතර පවතින අභ්‍යන්තර ගැටළුවක් බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණාධිපති විසින් ප්‍රකාශ කල අතර, මිලියන 29 ක පමණ ගෙවීම් ලබා ගැනීමට ඇති බව DECMA ආයතනයේ සභාපති ප්‍රකාශ කල ද ඒ සඳහා බිල්පත් ඉදිරිපත්ව නොමැති බවය. ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කරන ලද්දේ මේ සම්බන්ධයෙන් දෙවරකදී (2010 හා 2024 වර්ෂවලදී) පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කර ඇති බවත්, මෙය මෙම ආයතන දෙකෙහි පවතින ගැටළුවක් බවත්, මෙම විගණන කමිටුවේදී විසඳුමක් ලබා දිය නොහැකි වන බවත්ය. | | | |
| 29 | ආයතන භූමියෙහි පහත විස්තර සඳහන් වාහන 18 ක් වර්ෂ ගණනාවක් තිස්සේ වැස්සට අව්වට නිරාවරණය වෙමින් පැවතීම.<br>වාහන අංකය ලියාපදිංචි අයිතිකරු<br>36-9468 කෘෂි.දෙපා. කොළඹ<br>24-7526 කෘෂි.දෙපා.පේරාදෙණිය<br>32-1144පළාත් සමාජ සේ.දෙ. කොළඹ | මේවා ධාවනයට යොදා ගත නොහැකි පැරණි වාහන බැවින් ඉදිරියේදී වෙන්දේසිය සඳහා ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය.<br>පළමුව උතුරු මැද පළාත් සභාවට අයත් වාහන සම්බන්ධයෙන් අපහරණ කටයුතු කල යුතු බවත්, අනෙකුත් වාහන ප්‍රධාන ලේකම් | • ප්‍රධාන ලේකම් කාර්යාලයේ අපහරණ කමිටුවට වාහන 05 ක් යොමුකල බවත් එවා අතුරින් 03 ක් මුදල් ගෙවා රැගෙන ගොස් ඇති බවත්, 02 ක් සඳහා මෙතෙක් මුදල් ගෙවා නොමැති බවත් නි.ප්‍ර.ලේ.(පාලන) විසින් ප්‍රකාශ කරන ලදී.<br>• වාහන 11 ක නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට ඇති බවත් ප්‍රකාශ කරන ලදී. | නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් ද සිදුකර ගත හැකි බැවින්, අයිතිය තහවුරු කර ගෙන නොමැති වාහන 11 | නි.ප්‍ර.ලේ(පාල න) | 13 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 31-1938 ප්‍ර.ලේකම්,උ.මැ.ප.<br>53-1469 පළාත් අධ්‍යා.දෙ.<br>13-3400 ක්‍රීඩා අමාත්‍යාං.කොළඹ<br>11-8150 UNDP කොළඹ<br>31-6753 දි.ලේකම්, අ.පුර<br>26-0753 වාරිමාර්ග දෙපා. කොළඹ<br>17-6156 අධ්‍යා. දෙපා.උ.මැප.<br>31-6737 පළාත් පා.දෙපා.<br>50-6131 කෘෂි.දෙපා. කොළඹ<br>31-3574 සැළසුම් ක්‍රි.අමාත්‍ය.කොළඹ<br>31-5541 කෘෂි.දෙපා.පේරාදෙණිය<br>54-7305 සැළසුම් ක්‍රි.අමාත්‍ය.කොළඹ<br>32-1880 ප්‍රධාන අමාත්‍යාං.උ.මැප.<br>50-4584 රාජ්‍ය සැප.දෙපා. කොළඹ<br>32-0946 දි.ලේකම්,රත්නපුර | නමින් පවරා ගැනීමට කටයුතු සිදුකරන ලෙසත් කමිටුව උපදෙස් දෙන ලදී. | | සම්බන්ධයෙන් අයිතිය හඳුනාගෙන ඊලග විගණන කමිටුවට පෙර වෙන්දේසි කිරීමේ මූලික කටයුතු අවසන් කරන ලෙස දන්වන ලදී. | | |
| **පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය** | | | | | | |
| | **<u>පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව</u>** | | | | | |
| 30 | **දීර්ඝ කාලීන බදු ඔප්පු සැදීමේ ප්‍රමාදයක් පැවතීම.** බදු ගොනු 1369 ක් පවතින බවත්, ඒ අතුරින් ගොනු 995 ක් ඉඩම් කොමසාරිස් ජනරාල් භාරයේද, ගොනු 339 ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේද, ගොනු 35 ක් තක්සේරු | දීර්ඝ කාලීන බදු ඔප්පු සෑදීම ප්‍රමාද වීමට ප්‍රධානතම හේතුව වී ඇත්තේ මිනින්දෝරු හා තක්සේරු දෙපාර්තමේන්තු වල ප්‍රමාදය බව ඉඩම් කොමසාරිස් විසින් විගණන හා | අදාල තොරතුරු මෙතෙක් ලබා දී නොමැති බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කරන ලදී. | නිශ්චිතව දක්වන කරුණු සහිතව තොරතුරු කඩිනමින් ලබා දෙන ලෙස නැවතත් දන්වන ලදී. | ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය/ පළාත් ඉඩම් කොමසාරිස්. | 09 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේද පවතින බව පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | කළමනාකරණ කමිටුව වෙත කරුණු පැහැදිලි කරන ලදී.<br>ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ පැවැත්වෙන විගණන කමිටුවේදී මෙම ප්‍රමාදය සම්බන්ධයෙන් විමසිය හැකි බැවින් ඊට අදාල තොරතුරු කාලරාමුවක්ද සහිතව ලබාදෙන ලෙස කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී. | | | | |
| 31 | මිනින්දෝරු ඊ.එම්.අමරසේකර මහතා විසින් අංක HC 184/2012 දරණ නඩුවෙන් නිදොස් කොට නිදහස් කිරීම හේතුවෙන් ඔහු විසින් මෙම නඩුව වෙනුවෙන් වැය කල නීතීඥ ගාස්තු ලෙස රු.1,277,000.00 ක මුදලක් ඉල්ලා සිටීම.<br><br>අමරසේකර මහතා විසින් වැය කල නීතීඥ ගාස්තු වෙනුවෙන් ඉදිරිපත් කල ඇති බිල්පත්වල නිවැරදිතාවය තහවුරු කර ගෙවීම් කරන ලෙස උපදෙස් ලැබී ඇතත් එම බිල්පත් තහවුරු කර ගැනීමේ ගැටළුවක් පවතින බව පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව නීතිපති වෙතින් ද විමසූ බවත් | මේ සම්බන්ධයෙන් සොයා බලා පිළිතුරක් ලබා දෙන බව දන්වන ලදී. | නීතීඥ ගාස්තු ලෙස නීතීඥවරයා විසින් අතින් ලියා අත්සන් කරන ලද බිල්පත් කිහිපයක් ඉදිරිපත් කර ඇත. | නීතීඥවරුන් සත්‍ය කරුණු ප්‍රකාශ කරන බවට ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී ඇති බැවින් ඔවුන් ප්‍රකාශ කරන කරුණු පිළිගත යුතු බවත්, ඒ අනුව මිනින්දෝරු ඊ.එම්.අමරසේකර මහතා විසින් එම නීතීඥ ගාස්තුව ගෙවූ බවට ඔහුගෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබා ගෙන ඔහු වෙත අදාල | නි.ප්‍ර.ලේ(පාලන) /පළාත් ඉඩම් කොමසාරිස් | 02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | නිවැරදිතාවය තහවුරු කරගෙන ගෙවීම් කරන ලෙස උපදෙස් ලැබී ඇති බව ද දන්වන ලදී. | | | ගෙවීම් සිදු කල හැකි බවත් දන්වන ලදී. | | |
| **පළාත් අමාත්‍යාංශයක් යටතට නොගැනෙන ආයතන** | | | | | | |
| | **පළාත් සැළසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව** | | | | | |
| 32 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මූල්‍ය දායකත්වයෙන් උතුරු මැද පළාත සඳහා 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට දස අවුරුදු තිරසර ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම.<br>• මෙම ව්‍යාපෘතියේ මුළු වටිනාකම රු. 27,606,176.00 කි. මෙම ව්‍යාපෘතියේ පළාත් ආදායම් හා පළාත් පාලනයට අදාල කොටස ක්‍රියාත්මක වේ.<br>රු. 9,000.000.00 ක් අගය වන "ගම" නැමැති ග්‍රන්ථය සහ ඊට අදාල වැඩසටහන් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමට හා එය ක්‍රියාත්මක කිරීමට උපයෝගී කරගෙන තිබූ බවට සාක්ෂි නොතිබීම. | දැනට මෙය භාවිතයට ගත නොහැකි මට්ටමේ පවතින බව පළාත් සැළසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන) විසින් ප්‍රකාශ කරන ලදී. මෙහිදී පුද්ගලික මට්ටමින් කටයුතු කර ඇති බවත්, කථිකාචාර්යවරුන්ගේ පුද්ගලික ගිණුම්වලට මුදල් බැර කර ඇති බවත්, මීට අදාලව කටයුතු කරන ලද නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කල යුතු බවත් නියෝජ්‍ය විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.<br>මේ සඳහා පූර්ණ විමර්ශනයක් සිදු කිරීමට කමිටුව විසින් තීරණය කරන ලදී.<br>ප්‍රධාන ලේකම්ගේ අංක NCP/CS/ED/15/3/2 හා 2025.06.11 දිනැති ලිපිය මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ වන විමර්ශන ඒකකය මගින් විමර්ශන සිදු කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇත. | විමර්ශන වාර්තා මෙතෙක් ලැබී නැත.<br>ගරු ආණ්ඩුකාරතුමා විසින් ප්‍රධාන ලේකම් සහ සියළු පාර්ශව කැදවා සාකච්ඡාවක් කල බවත් එහිදී අවසන් කර භාර දෙන බව ප්‍රකාශ කලද මේ දක්වා භාර දී නොමැති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැළසුම්) විසින් ප්‍රකාශ කරන ලදී.<br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විමර්ශන කටයුතු මෙම දිනවලද සිදු කෙරෙමින් පවත්න බව ද ප්‍රකාශ කරන ලදී. | | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, (පාලන) | 13 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **පළාත් පුහුණු ඒකකය** | | | | | |
| 33 | **කොරකහවැව පුහුණු මධ්‍යස්ථානය පළාත් පුහුණු ඒකකය වෙත භාර දීම**<br><br>අතරුදවුම් මුදල රු. 14,263,982.27<br>ගොඩනැගිල්ල භාරගැනීමට කමිටුවක් පත් කර තිබුණද උපකරණ නිශ්චිතව හඳුනා ගැනීමේ අපහසුව නිසාත් තාක්ෂණික දැනුම ඇති පුද්ගලයෙකු කමිටුවෙහි නොමැති නිසාත් ගොඩනැගිල්ල හා උපාංග භාර ගැනීම කමිටුව විසින් ප්‍රතික්ෂේප කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පුහුණු) විසින් දන්වා සිටින ලදී. | දැනට නිලධාරීන් වෙනස් වී ඇති බවත්, ශ්‍රවනාගාරය පළමුව භාර ගැනීමට එකග වී ඇති බවත්, නි.ප්‍ර.ලේ(ඉංජි)වැ.බ. විසින් ප්‍රකාශ කරන ලදී.<br>මෙම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු) සමග ගරු ආණ්ඩුකාරතුමා හමුවී සාකච්ජා කල බවත්, එහිදී 4 වන අදියරේ පවතින සුළු වැඩ ප්‍රමාණයක් මාස 03 ක පමණ කාලයක් තුල අවසන් කර සියලුම ලිපිගොනු (Drowing) සමග ගොඩනැගිල්ල භාරදීමට කොන්ත්‍රාත්කරු එකග වූ බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) ප්‍රකාශ කරන ලදී. එම වැඩ අවසන් වූ පසු කමිටුවක් මගින් උපකරණ සමග ගොඩනැගිල්ල භාර ගැනීමට පියවර ගන්නා බව ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. | මෙම ගොඩනැගිල්ල තවදුරටත් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව භාරයේ පවතී. 2025.12.31 දින වන විට 4 වන අදියරේ පවතින සුළු වැඩ ප්‍රමාණය අවසන් කර ඇත. කොන්ත්‍රාත්කරු ගොඩනැගිල්ලෙන් ඉවත්ව ඇත. ඉදිරියේදී උපයෝජනය කරන ආකාරය සම්බන්ධයෙන් මෙතෙක් තීරණයක් ගෙන නැත. ශ්‍රවනාගාරය භාවිතයට ගනිමින් පවතී. එක් කොටසක ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයක් පවත්වාගෙන යනු ලබයි. | මෙම කරුණ ඉවත් කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පුහුණු)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජි.) | 09 |

**03.** **රාජ්‍ය ගිණුම් කාරක සභාවේ/පළාත් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

**2026.03.03 දින සාකච්ඡා කරන ලද කරුණු**

| අනු අංකය | කාරක සභා නියෝගය | | පෙර විගණන හා කළමනාකරණ කමිටුවලදී ලබා දෙන ලද නිර්දේශ/තීරණ | ප්‍රගතිය | ප්‍රවර්තන කමිටු රැස්වීමේදී ලබාදුන් නිර්දේශ/තීරණය හා ක්‍රියාත්මක කර අවසන් කල යුතු දිනය | වගකිව යුතු නිලධාරියා | සාකච්ජා කල වාර ගණන |
|---|---|---|---|---|---|---|---|
| | යොමුව | නියෝගය | | | | | |
| 01 | පොළොන්නරුව පොදු වෙළඳ සංකීර්ණයේ ඉතිරි වැඩ නිම කිරීමේ ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 15 දින අවසන් කර භාර දී තිබූ අතර, එම ඉදිකිරීම්වල පැවති අඩුපාඩු නොසලකා රු.16,745,178 .00 ක අවසන් බිල්පත් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රඳවාගෙන තිබූ රු. 6,655,599 .00 ක රැදවුම් මුදල්, වාණිජ බැංකු | 2026.03.03 නියෝගය -<br>I. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හරහා මෙම කරුණ සම්බන්ධව සිදු කරන පරීක්ෂණය කඩිනමින් අවසන් කර කාරක සභාව වෙත වාර්තා කිරීමටත්,<br>II. මෙම කරුණ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ පොලීසිය වෙත මේ වන විට සිදු කර ඇති | ප්‍රධාන ලේකම්ගේ අංක NCP/CS/ED/15/3/2 හා 2025.06.11 දිනැති ලිපිය මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ වන විමර්ශන ඒකකය මගින් විමර්ශනය සිදු කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇත. | විමර්ශන වාර්තාව මෙතෙක් ලැබී නැත.<br>මෙම ව්‍යාපෘතිය පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. නගර සභාව වෙත මෙතෙක් විධිමත්ව භාර දී නැත.<br><br>නියෝග I - රාජ්‍ය පරිපාලන, අමාත්‍යාංශයේ පරීක්ෂණය සිදු කෙරෙමින් පවතී.<br>නියෝග II - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇත. | පළාත් පාලන ඉංජිනේරු හරහා මෙම ව්‍යාපෘතිය පොළොන්නරුව මහ නගර සභාව වෙත භාර දිය යුතු බවට සාකච්ජා විය.<br>රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යැවිය යුතු වාර්තා නොයැවීම සම්බන්ධයෙන් සාකච්ජා කල අතර, ඒවා කඩිනමින් යැවිය යුතු බව දන්වන ලදී. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් | 09 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ඇපකරයක් මත නිදහස්කර තිබූ නමුත් ව්‍යාපෘතියේ පැවති අඩුපාඩු අතරුදවුම් කාලය තුළද නිවැරදි කර නොතිබුණු අතර, අදාළ බැංකු ඇපකරයේ කාලයද ඉකුත්වීම හේතුවෙන් එම මුදලින් අඩුපාඩු නිවැරදිකර ගැනීමටද අපොහොසත් වී තිබුණි. | පැමිණිලි පිළිබඳව ක්‍රියාකාරීව ඉදිරි පියවර ගැනීමට කටයුතු කිරීමටත්,<br>III. මෙම ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත් සමාගම මගින් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අනෙකුත් ව්‍යාපෘති සම්බන්ධයෙන් තීරණයක් ගැනීම පිළිබඳ ආණ්ඩුකාරවරයා සමග සාකච්ඡා කර මාසයක් තුල(2026.04.03 දිනට පෙර) කාරක සභාව වෙත වාර්තා කිරීමටත්,<br>IV. භාරගත් ඉදිකිරීම් ව්‍යාපෘතිවල වැඩ නියමිත පරිදි නිම නොකල කොන්ත්‍රාත්කරුවන් | | නියෝග III - ආණ්ඩුකාරතුමා සමග සාකච්ඡා කර ඇත. එහෙත් මෙතෙක් කාරක සභාව වෙත වාර්තාව ඉදිරිපත් කර නැත.<br>නියෝග IV - කොන්ත්‍රාත්කරු අසාධුගත කර නැත.<br>නියෝග V - හිග බදු මුදල් සහ හිග එක්වන් මුදල් අයකර ගැනීම සඳහා පවතින ගැටළු පිළිබඳව විමර්ශනයක් සිදුකර නැත. | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | සහ අඩුපාඩු සහිතව ව්‍යාපෘති සිදු කර ඇති කොන්ත්‍රාත්කරුවන් අසාධුගත කිරීමට පියවර ගෙන ඒ පිළිබඳව ප්‍රසම්පාදන කොමිෂම දැනුවත් කර මාසයක් තුල(2026.04.03 දිනට පෙර) කාරක සභාව වෙත වාර්තා කිරීමටත්,<br>V. පොළොන්නරුව පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමරවල බදුකරුවන්ගෙන් හිග බදු මුදල් සහ හිග එක්වන් මුදල් අයකර ගැනීම සඳහා පවතින ගැටළු පිළිබඳව උතුරු මැද පළාත් සභාව මගින් විමර්ශනයක් සිදුකර මාසයක් තුල (2026.04.03 දිනට | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | පෙර) කාරක සභාව වෙත වාර්තා කිරීමටත්, ප්‍ර.ග.නි. සහ ග.නි. කාරක සභාව සමග එකග විය. | | | | | |
| 02 | හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදි කිරීම-ගිවිසුම්ගත කොන්ත්‍රාත් වටිනාකම රු.598,013,000.00 හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.598,013,000.00 ක මුදලකට ගිවිසුම් ගත වූ සමාගම ව්‍යාපෘතිය අඩක් නිමකර රු.369,171,165.00 ක ගෙවීම් ලබාගෙන ව්‍යාපෘතිය නවතා දමා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.119,602,600 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබාදී තිබුණි. ව්‍යාපෘතිය | කඩිනමින් විමර්ශනයක් සිදු කිරීමට නියෝග කර ඇත. | ප්‍රධාන ලේකම්ගේ අංක NCP/CS/ED/15/3/2 හා 2025.06.11 දිනැති ලිපිය මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ වන විමර්ශන ඒකකය මගින් විමර්ශන සිදු කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇත. මෙම ව්‍යාපෘතිය නිම කිරීමට පළාත් සභාවට නොහැකි තත්වයක් ඇති බැවින් සංචාරක සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විමර්ශනය සිදු කරමින් පවතී.<br><br>මු.රෙ.104(4) පරීක්ෂණය සඳහා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක NCP/CM/EDU/08/02/250/2017 හා 2025.07.21 දිනැති ලිපියෙන් පහත කමිටුව පත් කර ඇත.<br>සභාපති - B.A.N.ජයලත් මයා, තත්ව පාලන ඉංජිනේරු<br>සාමාජික - B.M.R.T.ඒකනායක මයා, සහකාර ලේකම්(මුදල්), පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය<br>සාමාජික - C.S.K.ධර්මසේන මයා, පරිපාලන නිලධාරී, පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව. | මු.රෙ.104 වාර්තා හැකි ඉක්මනින් ලබා දෙන ලෙස දන්වන ලදී. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් | 10 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ඉදිකිරීම නවතා වසර 06 ක් ඉක්මවා ඇතත්, ලබාදුන් අත්තිකාරම් මුදලින් තවදුරටත් අයකරගත යුතුව පැවති මුදල රු.45,171,484.00 ක් විය. අත්තිකාරම් සඳහා ලබාගත් අත්තිකාරම් සුරක්ෂණ බැඳුම්කරය කල් ඉකුත් වී තිබුණි. ව්‍යාපෘතිය සම්පූර්ණ කර භාවිතයට ගැනීමට හැකි තත්ත්වයට පත්කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මේ දක්වා දැරූ රු.369,171,165.00 ක මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද 12 වන අතුරු බිල්පතින් වැඩබිමේ ඇති ඉදිකිරීම් ද්‍රව්‍ය වෙනුවෙන් රු.11,611,385.00 ක් ගෙවා | | ගොඩනැගිල්ල සංචාරක සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කොට පවත්වාගෙන යාම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති බවත් මේ පිළිබඳව කොන්ත්‍රාත්කරුද කැඳවා ගරු ආණ්ඩුකාරතුමා සමග ද සාකච්ඡා කල බව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | කමිටු වාර්තාව මෙතෙක් ලබා දී නැත.<br><br>කමිටු සභාපති B.A.N.ජයලත් මහතා විසින් ප්‍රකාශ කරන ලද්දේ විශාල ව්‍යාපෘති 04 කට අදාලව මු.රෙ.104 පරීක්ෂණ කමිටු සභාපති ලෙස තමන් පත් කර ඇති බවත්, එම කමිටු 04 ටම අදාල වාර්තා මාස 1 ½, 2 ක් පමණ කාලයකදී ලබා දීමට හැකි වෙතැයි බලාපොරොත්තු වන බවය. | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | තිබූ නමුත්, 2023 දෙසැම්බර් 15 දිනවන විට එවැනි වටිනාකමට අදාළ ද්‍රව්‍ය වැඩබිම තුළ නොතිබුණි. | | | | | | |
| 03 | පලුගස්දමන මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම-ගිවිසුම්ගත කොන්ත්‍රාත් වටිනාකම-රු. 542,019,300.00.00<br>ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 100 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබියදී අදාල ගොඩනැඟිල්ල සඳහා මූලික ඉදිකිරීම් ප්‍රමාණයක් පමණක් සිදුකර අතහැර දැමීම.<br>• රුපියල් මිලියන 100 ක අත්තිකාරම් සුරක්ෂණය කල් ඉකුත්වීමට ඉඩහැර තිබීම.<br>ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් වූ ii වන බිල්පත අනුව | ප්‍රශ්නගත ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී පාසැල් අවශ්‍යතාවය පිළිබඳ නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොමැති බව පෙන්වා දුන් කාරක සභාව බිල්පත් වටිනාකම හා තත්‍ය ඉදිකිරීම් සසඳා බැලීම් සඳහා පත් කර තිබූ කමිටුවල විනිවිදභාවය පිළිබඳව ගැටළුවක් පවතින බවද නිරීක්ෂණය කළේය. මෙම ව්‍යාපෘතිය තුලදී ප්‍රශ්නගත කොන්ත්‍රාත්කරුගේ පාර්ශවයෙන් යම් අඩුපාඩුවක් සිදු වී තිබේද යන්න රාජ්‍ය පරිපාලන, | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විශේෂ විමර්ශන ඒකකය මගින් අතිරේක ලේකම්, විමර්ශන යටතේ මෙම අක්‍රමිකතාවය සඳහා සම්බන්ධ වූ නිලධාරීන් පිළිබඳව විමර්ශනයක් ආරම්භ කර ඇත.<br><br>මිලියන 100 න් මිලියන 87 ක් ඉදිරිපත් කර තිබූ බිල්පත් 03 කින් අඩුකරගෙන ඇත. තවදුරටත් මිලියන 13 ක් අයකර ගත යුතුව ඇත. | • මු.රෙ.104(4) පරීක්ෂණය සඳහා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක NCP/CM/EDU/08/02/PSDG/2016 හා 2025.07.21 දිනැති ලිපියෙන් පහත කමිටුව පත් කර ඇත.<br>සභාපති - B.A.N.ජයලත් මයා, තත්ව පාලන ඉංජිනේරු<br>සාමාජික - B.M.R.T.ඒකනායක මයා, සහකාර ලේකම්(මුදල්), පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය<br>සාමාජික - C.S.K.ධර්මසේන මයා, පරිපාලන නිලධාරී, පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව<br>• කමිටු වාර්තාව මාස 02 ක් තුල ලබා දෙන බව ප්‍රතාශ කර ඇත. | | ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය | 10 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | වැඩබිම තුළ රු.7,961,875.00 ක ඉදිකිරීම් ද්‍රව්‍ය පවතින බව සඳහන් කරමින් ඉන් සියයට 80 ක් සඳහා රු.6,369,500.00 ක් ගෙවීමට නිර්දේශකර තිබූ නමුත් එවැනි ඉදිකිරීම් ද්‍රව්‍ය කිසිවක් වැඩබිම තුළ නොවීම. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් සිදු කෙරෙන විමර්ශනය මගින් නිරවුල් කර ගත යුතු බව ද කාරක සභාව නිරීක්ෂණය කළේය. **2026.03.03 නියෝගය-** රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් සිදු කෙරෙන විමර්ශනයේ කටයුතු කඩිනමින් අවසන් කර මාසයක් ඇතුළත (2026.04.03 දිනට පෙර) කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි සහ ග.නි. කාරක සභාව සමග එකඟ විය. | | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විශේෂ විමර්ශන ඒකකය මගින් විමර්ශන කටයුතු සිදු කෙරෙමින් පවතී. | | | |
| 04 | ගංවතුර නිසා හානියට පත් මාර්ග 53 ක් ප්‍රතිසංස්කරණය සඳහා වන ව්‍යාපෘති | **2026.03.03 දින නියෝගය -** 1. මෙම ව්‍යාපෘතිය තුල සිදුව ඇති අක්‍රමිකතා | පළාත් සභාව මගින් කොන්ත්‍රාත්කරු අසාදුලේඛණ ගත | ❖ පළමු නියෝගයට අදාලව මෙම ව්‍යාපෘතිය තුල සිදුව ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් | පළමු නියෝගයට අදාලව මෙම ව්‍යාපෘතිය තුල සිදුව ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් | සාමාන්‍යාධිකාරී,ප. මා.සං.අධිකාරිය/නි .ප්‍ර.ලේ(මුදල්) | 04 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දීමේදී සිදු වී ඇති අක්‍රමිකතා | සම්බන්ධයෙන් නීතිපතිවරයා වෙත කඩිනමින් දන්වා යැවීමට ප්‍ර.ග.නි. කාරක සභාව සමග එකග විය<br>II. අවිධිමත් ලෙස රු.මිලියන 3.58 ක ටෙන්ඩර් මන්ඩල දීමනා ලබා ගත් නිලධාරීන්ගෙන් එම මුදල කඩිනමින් ආපසු අයකර ගැනීමට කටයුතු කර කාරක සභාව වෙත වාර්තා කිරීමටත්,<br>III. මෙම ව්‍යාපෘතිය තුල සිදු වී ඇති මුල්‍ය වංචාවන්ට සම්බන්ධ කොන්ත්‍රාත් සමාගම අසාධුගත කිරීමේ හැකියාව පිළිබඳ සොයා බලා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග | කිරීමට ඇති නීතිමය නොහැකියාව පිළිබද සාකච්ජා විය.<br>බේරුම්කරණයට අදාලව අවශ්‍ය තොරතුරු ලබා දෙන ලෙසත්, කාන්ති කන්ස්ට්‍රක්ෂන් ආයතනය විසින් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග මත එම ආයතනයට ගෙවීම් කිරීමට සිදු වුව හොත් එයට වගකිව යුත්තේ කවුරුන්ද යන්න පිළිබද තීරණයක් ගෙන තිබිය යුතු බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. වැරදි තීරකවරයෙකු පත්කල අධ්‍යක්ෂ මණ්ඩලය මෙයට | නීතිපතිවරයා වෙත යැවිය යුතු තොරතුරු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් එවා ඇති බවත්, එය නීතිපති වෙත යැවීම නීති අංශය මගින් සිදු විය යුතු බවත් නි.ප්‍ර.ලේ(මුදල්) විසින් ප්‍රකාශ කරන ලදී.<br>❖ දෙවන නියෝගයට අදාලව ටෙන්ඩර් මණ්ඩල දීමනා ලබා ගත් එවකට පළාත් භාණ්ඩාගාරයේ ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ ලෙස සේවය කල නිලධාරිණියගෙන් අය කර ගැනීම් කිරීමට ඇති බවත්, මේ වන විට ඇය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘතියක සේවය කරන බැවින් අය කිරීම් සිදු කර ගැනීමට එම ආයතනයට දැන්වූ බවත්, ඒ අනුව එම අය කිරීම ඔවුන් වෙත සිදු කිරීමට නොහැකි බැවින් නීති කටයුතු කරන ලෙස දන්වා එවා | නීතිපතිවරයා වෙත දන්වා යැවීම නීති අංශය මගින් සිදු කරන ලෙස දන්වන ලදී.<br><br>දෙවන නියෝගයට අදාලව මෙම ව්‍යාපෘතියේ ටෙන්ඩර් පත් සැකසීම, ටෙන්ඩර් තීන්දු සටහන් කිරීම සිදු කල කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනා සහ පරිගණක ක්‍රියාකරු යන තිදෙනා වෙතින් අය කිරීම සම්බන්ධයෙන් විගණනයේ අදහස වන්නේ මෙම ප්‍රසම්පාදන කටයුත්තම නීති විරෝධී ලෙස සිදු කර ඇති බැවින් අයකිරීම්වලින් නිදහස් කිරීමට එකගවිය නොහැකි වන නමුත්, මෙම කමිටුවේදී ඔවුන්ගෙන් එම මුදල අය නොකිරීමට ගන්නා තීරණයට අදාලව පසුවිපරමක් සිදු නොකරන බව ද ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. එම සහය කාර්ය | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ගැනීමටත් ප්‍ර.ග.නි. සහ ග.නි. කාරක සභාව සමග එකග විය. | වගකිව යුතු වන බවද ඇයගේ අදහස විය. | ඇති බවත් නි.ප්‍ර.ලේ(මුදල්) විසින් ප්‍රකාශ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ටෙන්ඩර් පත් සැකසීම, ටෙන්ඩර් තීන්දු සටහන් කිරීම සිදු කල කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනා සහ පරිගණක ක්‍රියාකරු යන තිදෙනා වෙතින් අය කිරීමට දැන්වීමේදී ඔවුන් විසින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ නොවූ බව සඳහන් කරමින් අය කිරීම් නොකරන ලෙසට අභියාචනා කර තිබූ බවත්, එම අභියාචනා රාජ්‍ය ගිණුම් කාරක සභාව හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කල බවත් ප්‍රකාශ කල අතර, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ඒ සඳහා ජාතික විගණන කාර්යාලයෙන් එකගතාවය ලබා ගන්නා ලෙස දැක්වෙන අදහසක් දන්වා එවා තිබූ බැවින් එය ජාතික | මණ්ඩලය තීන්දු තීරණ ගැනීමට සම්බන්ධ වී නොමැති බැවින් ඔවුන්ගෙන් අය නොකිරීමට විගණන කමිටුවේ විරෝධයක් නොමැති බව දැන්වීය. | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | විගණන කාර්යාලය වෙත යොමු කල බව ද නි.ප්‍ර.ලේ(මුදල්) විසින් ප්‍රකාශ කරන ලදී.<br>තාක්ෂණ කමිටු සාමාජිකයන් අතුරින් එවකට අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරී ලෙස සේවය කල ජී.ඩබ්.සුමිත්‍රා විතාන මිය හැර ඉතිරි සියළු සාමාජිකයින් අදාල දීමනා අධිකාරිය වෙත ගෙවා අවසන් කර ඇත. ජී.ඩබ්.සුමිත්‍රා විතාන මිය මේ වන විට විශ්‍රාම ලබා ඇති අතර, ඇය පදිංචි ස්ථානය සොයාගත නොහැකිව ඇති බව සාකච්ඡා විය.<br>තුන්වන නියෝගයට අදාලව කොන්ත්‍රාත් සමාගම අසාධුගත කිරීම සඳහා පියවර නොගත් බවත්, දැනට ක්‍රියාත්මක බේරුම්කරණ ක්‍රියාවලියේ තීන්දුව ලබා දුන් පසු ඒ සඳහා ක්‍රියාකරන බවත් නි.ප්‍ර.ලේ(මුදල්) විසින් ප්‍රකාශ කරන ලදී. ඒ පිළිබදව | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ජාතික විගණන කාර්යාලය වෙත දන්වා එවන ලෙස ජොෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.<br>❖ මේ සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, ඉදිරි කටයුතු කිරීමට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.<br>❖ මු.රෙ.104 පරීක්ෂණය සදහා පළාත් පාලන අමාත්‍යාංශය මගින් කමිටුවක් පත් කර ඇත. | | | |
| 05 | උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා තාක්ෂණික ප්‍රමිතියෙන් යුතු වාර්තාමය වීඩියෝ වැඩසටහනක් සකස් කිරීම, ආකර්ශණීය පින්තූර සහිත ප්‍රමිතියෙන් යුතු පොතක් නිර්මාණය කිරීම සහ | විධිමත් ක්‍රමවේදය අභිබවමින්, විවෘත ලංසු කැඳවීමකින් තොරව පෞද්ගලික පැපයුම්කරුවෙකු වෙත ලබා දී ඇති මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වන ව්‍යාපෘති වාර්තාවේ | මේ සම්බන්ධයෙන් වාර්තාවක් පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.<br>මූලික විමර්ශනය සිදු කර නිලධාරීන්ට විරුද්ධව සකස් කරන ලද චෝදනා පත්‍ර රාජ්‍ය පරිපාලන | 1. මු.රෙ.104(4) පූර්ණ වාර්තාව අනුව හදුනාගන්නා ලද වගකිව යුතු නිලධාරීන්ගේ වැටුපෙන් අදාල අධිභාර අයකර ගැනීමට 2026.02.13 දිනැතිව ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. අදාල නිලධාරීන් විසින් 2026.02.20 හා | කමිටු සාමාජික අල්ගේවත්ත මිය එම කමිටුවෙන් ඉවත් වීමට ඉල්ලා ඇති බව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කල අතර, කමිටුවකට පත් කිරීම විධිමත් රාජකාරි පැවරීමක් බවත්, කිසිදු නිලධාරියෙකුට සබැදියාවන් සමග සට්ටනයක් පවතින | ලේකම්, ප්‍රධාන අමාත්‍යංශය | 09 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | විධිමත් තොරතුරු සහිත වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධව සිදුව ඇති අක්‍රමිකතා | අදාල පිරිවිතර නිසි පරිදි සඳහන් කර හෝ නොමැති බව කාරක සභා නිරීක්ෂණය කළේය. එසේම, මෙලෙස යම් අක්‍රමිකතාවයක් සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් සිදු වූ අලාභයක් ආපසු අයකර ගැනීම සඳහා තීරණයක් ගන්නා අවස්ථාව වන විට ප්‍රශ්නගත සිද්ධිය සිදු වී කාලයක් ගත වී තිබෙන බවත්, එම කාල සීමාවතුල මුදලෙහි අගය වෙනස්වීම සැළකිල්ලට ගැනීමකින් තොරව අලාභයේ සංඛ්‍යාත්මක අගය මත පදනම්ව ආපසු ගෙවිය යුතු මුදල තීරණය කරනු ලැබීම හේතුවෙන් මෙවැනි අක්‍රමකතා වැරදි | අමාත්‍යාංශයට යොමු කර ඇත.<br>මු.රෙ.104 (ප.මු.රී.54) කමිටු වාර්තාව ලැබී ඇත. එම වාර්තාව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත.<br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විමර්ශන ඒකකය මගින් වෙනම විමර්ශනයක් සිදු කර අංක MpubAd/AcSD/07/DIS/2639 හා 2025.02.18 දිනැති ලිපිය මගින් මූලික විමර්ශන වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.<br>අයකර ගැනීමට අදාලව නීතිමය පියවර ගැනීම | 2026.02.23 දිනැතිව අභියාචනා ඉදිරිපත් කර ඇත.<br>02. විශ්‍රාම ලබා සිටින හිටපු ප්‍රධාන ලේකම්ගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ එකගතවය විමසා 2026.02.11 දින ලිපියක් යොමු කර ඇත.<br>අභියාචනා සළකා බලා නැවත මු.රෙ.104(4) පරීක්ෂණය සිදු කිරීමට පහත කමිටුව පත් කර ඇත. (NCP/CM/FD/12/විගණන කමිටු/2026 හා 2026.05.20 ලිපිය මගින්)<br>සභාපති - සුභාජිනී මදියගලන් මිය, ලේකම්, පළාත් කෘෂි.අමාත්‍යාංශය<br>සාමාජික - ජේ.එම්.ඉලංගසිංහ මයා, ගණ:, පළාත් කෘෂි අමාත්‍යාංශය<br>සාමාජික-ඒ.ඩබ්.ඒ.එන්.කේ. අල්ගේවත්ත මිය, ප. නිලධාරී, ප්‍රධාන අමාත්‍යාංශය | අවස්ථාවක(conflict of interest) හැර එම රාජකාරියෙන් ඉවත්වීමට නොහැකි බැවින් එම රාජකාරිය ඉටු කරන ලෙස ඇය වෙත දැනුම්දෙන ලෙස දන්වන ලදී. | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | පූර්වාදර්ශ බවට පත්විය හැකි බවත් කාරක සභාවේ අදහස විය.<br>I. මෙම අක්‍රමිකතාව සඳහා වගකිව යුතු බවට විමර්ශන මගින් හඳුනාගත් නිලධාරීන් හතර දෙනාගෙන් මෙම ව්‍යාපෘතිය හරහා සිදු වී ඇති පාඩුව කඩිනමින් අයකර ගැනීමට පියවර ගැනීමටත්,<br>II මෙම අක්‍රමිකතාව පිළිබඳ තොරතුරු නීතිපතිවරයා හරහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත් ප්‍ර.ග.නි. සහ ග.නි. කාරක සභාව සමග එකඟ විය. | සඳහා 2021 වර්ෂයේදී නඩු පැවරීම සඳහා නීතිපති වෙත ගොණුවක් ඉදිරිපත් කර ඇති බව නීති නිලධාරී විසින් ප්‍රකාශ කරන ලදී. කොන්ත්‍රාත්කරු වන විදත් ජයවර්ධන මහතා 2023 වර්ෂයේදී ලිපියක් ලබා දෙමින් කොටස් වශයෙන් ලබා දෙන බවට දන්වා ඇති බැවින් එම ලිපිය මත පදනම්ව නඩු පවරා නොමැති බව ද නමුත් ඔහු ඒ අනුව කටයුතු කර නොමැති බැවින් නැවත නඩු පැවරීම සඳහා පැමිණිලි කෙටුම්පත් බොහෝ දුරට අවසන් කර ඇති බව නීතිපති දෙපාර්තමේන්තුව | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලද්දේ කමිටු සාමාජික අල්ගේවත්ත මිය එම කමිටුවෙන් ඉවත් වීමට ඉල්ලා ඇති බවය.<br><br>02. ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක NCP/CM/FD/12/ගිණුම් කාරක සභාව හා 2026.05.06 දිනැති ලිපිය මගින් මෙම අක්‍රමිකතාවය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කිරීමට අදාල ඉදිරි කටයුතු සිදුකර දෙන මෙන් නීතිපති වෙතින් ඉල්ලා ඇත. මෙම කරුණට අදාලව නඩු පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව සමග කටයුතු කරමින් පවතී. | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විමසීමේදී දැන ගැනීමට ලැබුණු බව ද ඇය විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව එහි තීරණයක් ලබා දෙන තෙක් නිලධාරීන්ගෙන් අය කිරීම සම්බන්ධයෙන් නැවත සලකා බැලීම සුදුසු බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ අදහස විය. | | | | |
| 06 | පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ආයතනමය කරුණු ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය සේවයේ අනුරූප ධූර දරන නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.4 ඡේදයේ වූ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ වුවද, ඊට | සියළු පළාත් සභාවලට අදාළ වන පරිදි ලේකම්වරුන්ට පමණක් නොව අනෙකුත් නිලධාරීන්ටද ගැලපෙන සාධාරණ ක්‍රමවේදයක් සකසන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත නියෝග කරන ලදී. | | 1990 ජූනි මස 05 දිනැති පීඩී/ඩීපී/3 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව ආයතන සංග්‍රහයේ විධි විධාන පළාත් රාජ්‍ය සේවාවේ නිලධාරීන්ටද අදාළ කරගත යුතුය. නමුත් වර්තමානය වන විටද කුලී වශයෙන් රු.1,000 ක මුදලක් සහ ජලය හා විදුලිය සඳහා 70% ක් පමණක් නිලධාරීන්ගෙන් අය කරනු ලබයි. | | නි.ප්‍ර.ලේ(පාලන) | 02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | පටහැනිව අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු නිලධාරීන් 17 දෙනෙකුගෙන් මාසිකව රු.500 ක උපරිමයකට යටත්ව නිවාස කුලී අය කර තිබුණු අතර එකී නිවාසවල ජල බිල්පත් හා විදුලි බිල්පත් වටිනාකමින් සියයට 70 ක් පළාත් සභාව විසින් ගෙවා තිබීම නිසා 2015 වර්ෂය දක්වා රජයට රු.1,199,338 ක පාඩුවක් සිදුවී තිබුණි. | **2026.03.03 නියෝගය -** උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් විසින් විශේෂ ක්‍රමවේදයක් යටතේ නිවාස කුලී අයකර ගැනීම සදහා කුමන පදනමක් යටතේ නිර්දේශ ලබා දී තිබුනේද යන්න සහ ආයතන සංග්‍රහයේ පවතින විධිවිධානවලට අනුකූලව පළාත් සභාවේ සියළු නිලධාරීන්ට සමානව අදාල වන පරිදි ක්‍රමවේදයක් සකස් කර ඒ පිළිබද තොරතුරු කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි. සහ ග.නි කාරක සභාව සමග එකග විය. | | නිල නිවාස පිළිබද තොරතුරු මේ වන විට ගෙන්වාගෙන ඇති බවත්, ඉදිරි සතිය තුල එම තොරතුරු ජාතික විගණන කාර්යාලයටද පිටපතක් සහිතව යොමු කරන බව නි.ප්‍ර.ලේ.(මුදල්) ප්‍රකාශ කරන ලදී. | | | |
| 07 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් වෙත බෙදා දීම | 2026.03.03 නියෝගය - ත්‍රිපෝෂ අස්ථානගතවීම සම්බන්ධව පොලිස් | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ත්‍රිපෝෂ | · මූලික විමර්ශනයක් පවත්වා නිරික්ෂණ හා නිර්දේශ සහිත වාර්තාවක් ලබා දෙන ලෙස | | ප.සෞ.සේ.අධ්‍යක්ෂ/අ.පුර ප්‍රා.සෞ.සේ.අධ්‍යක්ෂ | 09 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙන් ලැබුණු වටිනාකම රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂවලින් එකතු වටිනාකම රු.1,094,657 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 බැගින් අඩංගු මළු 77 ක් අස්ථානගත වී තිබූ අතර, රු.23,497,597 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 ක් අඩංගු මළු 1750 ක් අනුරාධපුර දුම්රියපළේ දුම්රිය ගැල්තුළ (Wagon) මාස 02 කට වැඩි කාලයක් නිදහස් කර ගැනීමකින් තොරව රඳවා තැබීමට ඉඩ හැර තිබුණි. දුම්රිය මැදිරි තුළ ත්‍රිපෝෂ පැවති කාලය තුළ පැවති සෙල්සියස් අංශක 45 ක උෂ්ණත්වය තුළ ත්‍රිපෝෂවල ගුණාත්මකභාවය අඩුවීමේ අවධානමක් පැවතුණි. වටිනාකම | පැමිනිල්ලක් සිදු කර නොමැති වීම අඩුපාඩුවක් බව පෙන්වා දුන් කාරක සභාව මෙම අක්‍රමිකතාවයට සම්බන්ධ සියළු නිලධාරීන් සඳහා සුදුසු විනය පියවර ගත යුතු වන බව ද ප්‍රකාශ කළේය. මෙම ත්‍රිපෝෂ පැකට් අස්ථානගතවීම, කල් ඉකුත්වීම සහ ප්‍රමාදවීමේ ගාස්තු ගෙවීමේ සිදුවීම පිළිබඳව උතුරු මැද පළාත් සභාවේ අභ්‍යන්තර විගණන අංශය හරහා නැවත විධිමත් පරීක්ෂණයක් සිදුකර කාරක සභාව වෙත වාර්තා කිරීමට ප්‍ර.ග.නි. සහ ග.නි කාරක සභාව සමග එකග විය. | සම්බන්ධ රාජකාරි එහි ගිණුම් අංශයට පවරන ලෙස දන්වන ලදී.<br>ත්‍රිපෝෂ බෙදා හැරීමේ ලේඛන විධිමත්ව පවත්වා ගන්නා ලෙසද ඒ සම්බන්ධ නිසි අධීක්ෂණයක් සිදු කරන ලෙසද ගණකාධිකාරී වෙත උපදෙස් දෙන ලදී. | රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත 2025 නොවැම්බර් 22 දින දැනුම් දී ඇත.<br>· මෙම කටයුත්තට සම්බන්ධ විෂය ලිපිකරු විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2.12 ප්‍රකාරව විශ්‍රාම යවා ඇත.<br>● පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව මගින් විමර්ශනය සිදු කර මේ වන විට වාර්තාව කෙටුම්පත් කරමින් පවතින බව ප්‍රධාන අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදී. | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂ තොගය ප්‍රතිලාභීන් වෙත ලැබෙන විට කල් ඉකුත්වීමට ආසන්නව පැවතුණි. මෙම ත්‍රිපෝෂ තොග නියමිත කාලය තුළ දුම්රිය ගැල්වලින් ඉවත් කර නොගැනීම නිසා ප්‍රමාද ගාස්තු ලෙස රු.1,080,000 ක මුදලක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදු වී තිබූ බව නිරීක්ෂණය විය. | | | | | | |
| 08 | 2021 පෙබරවාරි 01 දිනැති 2020/06 (i) චක්‍රලේඛය හා 2020 ඔක්තෝබර් 13 දිනැති හා අංක අමප/20/1622/322/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ඉඩම් කොමසාරිස්වරයා විසින් ඉඩම් කට්ටි 08 කට බදු සහන ලබා දීම හේතුවෙන් පළාත් | 2026.03.03 දින නියෝගය -<br>මෙම ගැටළුව කඩිනමින් නිරවුල් කර රජයට අයවිය යුතු හිග මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතු බව කාරක සභාව පෙන්වා දුන්නේය | 2025.06.11 දිනැතිව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් ඇමතූ ඉඩම් කොමසාරිස් ජනරාල් ගේ අංක 4/10/පොදු /බදු සහන//(1,2) දරණ ලිපිය අනුව මෙම ඉඩම් කට්ටි 08 සදහා ලබා දි තිබූ බදු සහන ඉවත් කර හිග බදු | බදුකරුවන් සමග සාකච්ජා කල බවත්, ඔවුන්ගේ ප්‍රතිචාර යහපත් මට්ටමක පැවති බවත්, 2026.06.30 දින වන විට පිළිතුරක් ලබා දෙන බවට ප්‍රකාශ කල බවත් පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී.<br>බදු සහනය අවලංගු කර ඇති බැවින් නිසි බදු මුදල අයවිය යුතු බවත් වර්ථමානය වන විටද බදු මුදල් | | පළාත් ඉඩම් කොමසාරිස් | 12 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | සභාවට රු.73,404,958 ක බදු මුදලක් අහිමි වී තිබුණි. (2024 පළාත් සභා වාර්තාවේ 1.6.1 ඇ ඡේදය) බදුකරුවන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.73,404,958 ක හිඟ බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | මුදල් ද සමග බදු අයකර ගැනිමට කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව නැනුප ප්‍රාදේශීය ලේකම් විසින් එම බදුකරුවන් දැනුවත් කර ඇත. එහෙත් ඔවුන් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති බව පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. අභියාචනා සඳහා මෙතෙක් පිළිතුරු ලැබී නැත. උපලේඛණ අවලංගු කිරීමට බදු ඔප්පු ආපසු භාර දෙන ලෙස දන්වා ඇතත් මෙතෙක් ඒවා භාර දී නොමැති බව පළාත් ඉඩම් | නොගෙවන බවත් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති ප්‍රකාශ කල අතර, පනත අනුව බලය ඇත්තේ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත බැවින් මේ සඳහා ඔහු විසින් කටයුතු කල යුතු බව පළාත් ඉඩම් කොමසාරිස් ප්‍රකාශ කරන ලදී. | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | | | | |
| 09 | මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් අක්කර 80 ක භූමි ප්‍රමාණයක් දේශීය ආයෝජකයින් 20 දෙනෙකු සඳහා 2022 වර්ෂයේ සිට දීර්ඝ කාලීන බදු අනුමැතියට යටත්ව වසර 35 ක කාලයකට ලබා දී තිබුණු අතර, බදු අනුමැති ලිපියේ “ ඇ” වගන්තිය ප්‍රකාරව බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී ඉඩම සංවර්ධනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට බලපත්‍රලාභීන් 16 දෙනෙකු එසේ ඉඩම් සංවර්ධනය සිදුකර නොතිබුණි.<br>(5.3 (ඇ) ඡේදය) | **2026.03.03 දින නියෝගය -**<br>ප්‍රතිලාභ රැසක් සහිත මෙම ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ ඉටුනොවී අතරමග නැවතීමට හේතු වූ කරුණු පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යංශයෙන් විමසීම සුදුසු බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br>මෙම කරුණ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යංශයෙන් විමසා කාරක සභාව වෙත වාර්තා කිරීමට ප්‍ර.ග.නි. සහ ග.නි කාරක සභාව සමග එකඟ විය. | | 2024 වර්ෂය අවසාන වන විට වාර්ෂික ඖෂධ අවශ්‍යතාවය සියයට 60 දක්වා වර්ධනය කිරීමට ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘතියේ ඉඩම් කට්ටි 22 ම ඉඩම් සංවර්ධන කටයුතු ආරම්භ නොකර තිබීමනේ වල්බිහි වී තිබුණි. | පළාත් ඉඩම් කොමසාරිස් වෙතින් තොරතුරු ලබාගෙන ප්‍රධාන ලේකම්ගේ අත්සනින් යුතුව රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් විමසා යැවීමට කටයුතු කරමින් පවතින බව සාකච්ඡා විය. | පළාත් ඉඩම් කොමසාරිස් | 02 |
| 10 | 2017 අගෝස්තු 02 දිනැතිව සංශෝධිත ගිවිසුම් වටිනාකම | 2026.03.03 දින නියෝගය - | • තීරකවරයකු පත්කර ඇත. CIDA | • මු.රෙ.104(4) වාර්තාව මගින් ලබා දී ඇති නිර්දේශ ප්‍රකාරව | • මෙම කරුණ සම්බන්ධයෙන් CECB ආයතනයේ විගණන හා | ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය | 17 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වූ රු.3,723,534,071 ක් අනුව විශේෂ මාර්ග සංවර්ධනය (නාගරික හා ප්‍රාදේශීය මාර්ග) කිරීමේ ව්‍යාපෘති 217 ක් සඳහා උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට (CECB) අත්තිකාරම් සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව ලබා දුන් රු.221,111,400 ක අත්තිකාරම් මුදලින් රු.128,316,501 ක් පියවා නොතිබුණි.<br>(5.4 ඡේදය) | මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය කාරක සභාව විමසූ අතර, 2009 වර්ෂයේදී ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණයක් මත පදනම්ව 2016 වර්ෂයේදී මෙලෙස සුරක්ෂණයක් රහිතව අත්තිකාරම් මුදල් ගෙවා ඇති බවත්, මෙම ව්‍යාපෘතියේ කාර්යයන් අතරමග නැවතී ඇති බවත්, හිග අත්තිකාරම් මුදල ආපසු ගෙවන ලෙස කරන ලද ඉල්ලීම්වලට CECB ආයතනය විසින් ප්‍රතිචාර දක්වා නොමැති බැවින් මේ සම්බන්ධව CECB ආයතනය අයත් වන වාරිමාර්ග අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බවත් ග.නි.ප්‍රකාශ කළේය. | ආයතනයට රු.325,000.00 මුදලක් ගෙවා ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අනුරාධපුර නාගරික මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා CECB ආයතනයට ලබා දුන් රු.128,316,501.76 ක අත්තිකාරම් මුදල පියවා නොගැනීම හා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැදීම් ඇතිකර ගැනීම සහ අත්තිකාරම් සුරක්ෂණය ලබා ගැනීමෙන් තොරව අත්තිකාරම් නිකුත් කිරීම හේතුවෙන් රජයට සිදු වූ මූල්‍යමය පාඩුව වෙනුවෙන් වගකිව යුත්තන් ලෙස කමිටුව විසින් හඳුනාගත් ප්‍රධාන අමාත්‍යාංශයේ එවකට ලේකම් ඩබ්.ටී.ඒ.මානෙල් මිය හා එවකට ගණකාධිකාරී ආර්.එම්.ජේ.ජේ.කේ.රාජකරුණා මිය වෙතින් රජයට සිදු වී ඇති පාඩුව පූරණය කල යුතු බවට නිර්දේශ කර ඇත. | කළමනාකරණ කමිටුවේදී සාකච්ජා කිරීමට යොමුකල බවත්, එම ආයතනයේ දැනට සිටින නිලධාරීන් මෙම කරුණ පිළිබඳව දැනුවත් නොවන බවත් එහි ගිණුම් තුලද මෙම මුදල ඇතුලත්ව නොමැති බැවින් ඊලග විගණන කමිටුවේදී මේ සම්බන්ධයෙන් සාකච්ජාවට ගනු ඇතැයි ද කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ප්‍රකාශ කරන ලදී. | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ඒ අනුව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක NCP/CM/FD/12/විගණන කමිටු/2026 හා 2026.05.20 දිනැති ලිපිය මගින් එම දෙදෙනා වෙත රු.128,316,501.76 ක මුදලින් 50% බැගින් එනම් රු.64,158,250.88 බැගින් 2026.06.30 දිනට පෙර ගෙවන ලෙස දන්වා ඇත.<br>• මෙහිදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලද්දේ 2017 වර්ෂයේදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සමග ගිවිසුම්ගතව මෙම මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති බවය. ඊට අදාලව අධිකාරිය වෙතින් සොයාගත් තොරතුරු අනුව කොන්ත්‍රාත්කරු CECB ආයතනය බවත්, උපදේශනය පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය බවත්, සේවායෝජකයා ප්‍රධාන | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අමාත්‍යාංශය බවත්, ඉංජිනේරු ලෙස සාමාන්‍යාධිකාරී..... හා පළාත් පාලන ඉංජිනේරු කටයුතු කර ඇති බව ද ප්‍රකාශ කරන ලද අතර, සොයාගත් තොරතුරු අනුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඇස්තමේන්තු සකස් කර දී ඇති බව ද ප්‍රකාශ කරන ලදී. එසේම CECB ආයතනය විසින් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සම්බන්ධ කර නොගනිමින් කටයුතු කිරීම හේතුවෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලිඛිතව දැනුම් දී මෙම කාර්යයෙන් ඉවත් වී ඇති බව ද එම අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී. | | | |
| 11 | අංක පීඑස්/සීඑස්ඒ/11-18 හා 2018 ඔක්තෝබර් 12 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 4.3 ඡේදය අනුව හිටපු ආණ්ඩුකාර තුමා වෙත | 2026.03.03 දින නියෝගය - මෙම ගෙවීම සිදුකල ක්‍රමවේදය සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු | | සීමාව ඉක්මවා ගෙවා ඇති රු.1,177,000 ක මුදල ආපසු ගෙවා ඇත.<br>ගෙවීම් සිදු කිරීමට තීරණ ගෙන ඇති නිලධාරීන් දෙදෙනාම විශ්‍රාම ගෙන | ගෙවීම් සිදු කිරීමට ක්‍රියාකර ඇති නිලධාරීන් විශ්‍රාම ගොස් ඇති බවට දන්වා එවන ලෙසත් ඒ අනුව එය කාරක සභාව වෙත යොමු කිරීමටත් තීරණය විය. | ආණ්ඩුකාරවර ලේකම් | 02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | නිල වාහන 02 ක් හා අවශ්‍ය නම් ආරක්ෂක රථයක් ලබා ගැනීමත් එම එක් රථයකට මසකට ඩීසල් ලීටර් 500 ක වටිනාකමකට සමාන ඉන්ධන දීමනාවක් ලබාගැනීමට හිමිකම් තිබුණු නමුදු 2020 අප්‍රේල් සිට 2021 ජූනි 21 දක්වා වූ මාස 12 ක කාල පරිච්ඡේදය තුළ එවකට හිටපු ආණ්ඩුකාරතුමන් වෙත මසකට ඩීසල් ලීටර් 1500 ක් ඉක්මවා අතිරේකව එකී මාස 12 තුළ රු.1,177,000 ක වටිනාකමකට සමාන ඩීසල් ලීටර් 11,320 ක් ජනාධිපති ලේකම්ගේ පූර්ව අවසරය ලබා ගැනීමකින් තොරව හිටපු ආණ්ඩුකාරතුමන් වෙත අවිධිමත් ලෙස ගෙවීම් කර තිබුණි. | කර කාරක සභාව දැනුවත් කිරීම සුදුසු බව කාරක සභාවේ අදහස විය.<br>මෙම ගෙවීම සම්බන්ධයෙන් අදාල චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ක්‍රියාකර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් මාසයක් ඇතුළත (2026.04.03 දිනට පෙර) කාරක සභාව වෙත ලබා දීමට ප්‍ර.ග.නි සහ ග.නි. කාරක සභාව සමග එකඟ විය. | | ඇති බව ආණ්ඩුකාරවර ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | ඉදිරියේදී මෙවැනි ගෙවීම් සිදුනොකිරීමට අවධානය යොමු කල යුතු බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් දන්වන ලදී. | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 12 | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ලංසු ඇගයීම් කරන අවස්ථාවේදී තාක්ෂණික පිරිවිතරවලට අනුකූලව ලංසු ඉදිරිපත් කර තිබිය දී හා අලෙවියෙන් පසු සේවා සැපයීමට නියෝජිතවරයකු සිටිය දී සේවා ස්ථානයක් නොමැති ලෙස දක්වා අවම මිල ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අවස්ථා 02 කදී Smart board 135 ක් මිලදී ගැනීමේදී රු.4,050,000 ක හා Desktop Computer 207 ක් මිලදී ගැනීමේදී රු.7,890,840 ක අලාභයක් සිදුවී තිබුණි. | **2026.03.03 දින නියෝගය -** විගණන නිරීක්ෂණ අනුව මෙම මිළදී ගැනීම් හේතුවෙන් රජයට අලාභයක් සිදුව ඇති බව පෙනී යන බැවින් මෙම මිළදී ගැනීම් අවස්ථා දෙක සම්බන්ධයෙන් කටයුතු කල ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු මගින් අදාල කාර්ය භාරය නිවැරදිව සිදුවී තිබේද යන්න සොයා බැලීම සුදුසු බවත්, මින් ඉදිරියට ප්‍රසම්පාදන නිර්නායක සැකසීමේදී තාක්ෂණික උපදෙස් මත වඩාත් ප්‍රායෝගික කොන්දේසි ඇතුලත් කල යුතු බවත් කාරක සභාව පෙන්වා දුන්නේය. | මෙවැනි මිලදී ගැනීම් සඳහා manufacture authorization ඇති අය වෙතින් මිල ගණන් කැඳවීම සිදුකල යුතු බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කල අතර, අදාල පිටරට සමාගම විසින් මෙරට ලංසුකරු වෙත manufacture authorization දිය යුතු බව ද ප්‍රකාශ කරන ලදී. එහිදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(මුදල්) විසින් ප්‍රකාශ කරන ලද්දේ තෝරාගත් සැපයුම්කරු | අදාල වාර්තාව හා සියළු ලියවිලි 2026.03.30 දින ගිණුම් කාරක සභාව වෙත යොමු කර ඇත.<br><br>Desktop Computer 207 ක් මිළදී ගැනීම පිළිබදව මෙහි සඳහන්ව ඇතත් එම කරුණ පිළිබදව විගණනය විසින් කිසිදු අවස්ථාවක විගණන කමිටුවකදී විමසීම් කර නොමැති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැළසුම්) ප්‍රකාශ කල අතර, තමා මෙම මිලදී ගැනීමට අදාල අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයෙකු බවත්, පෙර පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමකදී මෙහි ගැටළුවක් නොමැති බව පිළිගෙන ඉවත් කිරීමට එකඟ වී ඇති නමුත්, නැවත නැවත මෙම කරුණ ඉදිරිපත්වීමට හේතු අපැහැදිලි බව ප්‍රකාශ කරන ලදී. | | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | 02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | I. මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල ටෙන්ඩර් ලියවිලි සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ ලිපි ලේඛන ඇතුළු තොරතුරු කාරක සභාව වෙත යොමු කිරීමටත්,<br>II. මෙම මිළදී ගැනීමේදී සිදුව ඇති අලාභය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දෝශ පිළිබද විගණන විමසුම් සදහා ලබා දුන් පිළිතුරු මාසයක් තුළ (2026.04.03 දිනට පෙර) කාරක සභාව වෙත යොමු කිරීමටත් ප්‍ර.ග.නි සහ ග.නි. කාරක සභාව සමග එකඟ විය. | manufacture authorization ඇති අයෙකු බවය. | | | | |
| 13 | ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සෞඛ්‍ය සේවයේ ගුණාත්මක බව වර්ධනය කිරීම එනම්, ජීවිත | **2026.03.03 දින නියෝගය -** | | අරමුණට පටහැනිවීම හැර මේ තුල මුල්‍ය වංචාවක් සිදුව නැති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) | 2027 වර්ෂයට මුදල් වෙන් කර ගෙන මෙම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කර පූර්ණ | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | 02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | කාලය පුරාම විස්තීර්ණ, ප්‍රවර්ධන, ආරක්ෂණ, වැළැක්වීම්, රෝග නිවාරණ, පුනරුත්ථාපන හා රෝග සත්කාර මගින් ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම මෙන්ම බෝ නොවන රෝග අවධානම ඇති පුරවැසියන් හඳුනාගෙන එම රෝග පාලනය කිරීම හා කළමනාකරණය කිරීම අරමුණින් ලෝක බැංකු ආධාර යටතේ 2019 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ ද, එම අරමුණුවලට පටහැනිව 2019 වර්ෂයේ සිට 2024 ජුලි 31 දින දක්වා මෙම ව්‍යාපෘතිය යටතේ ලද ප්‍රතිපාදනවලින් රු.335,691,431 ක මුදලක් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සත් | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ලෝක බැංකු ආධාර යෙදවීම වෙනුවට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවය වැඩි දියුණු කිරීමට ප්‍රාදේශීය රෝහල්වල යටිතල පහසුකම්වල පවතින අඩුපාඩු සම්පූරණ කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු බව සහ එය උක්ත ව්‍යාපෘතියේ අරමුණ වන බව කාරක සභාව අවධාරණය කළේය. මෙම සිදුවීම ආශ්‍රිත කරුණු සළකා බැලීමේදී දේශපාලන අධිකාරිය සහ නිලධාරීන් එකිනෙකාගේ නීතිමය රාමුව තුල පිහිටා | | ප්‍රකාශ කල අතර, පූර්ණ උපයෝජනයට වැඩපිළිවෙලක් සකස් කල යුතු බව ද ප්‍රකාශ කරන ලදී. පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යාලය ද මෙම ගොඩනැගිල්ලට රැගෙන යන්නේ නම් ඉතිරි වැඩ නිම කිරීම සඳහා මුදල් ලබාදීමට හැකි බව රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී සාකච්ඡා කල බව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් ප්‍රකාශ කරන ලදී. | උපයෝජනයට ගැනීම සුදුසු බව සාකච්ඡා විය. | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | මහල් නව පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වැය කර තිබූ අතරම රු.51,609,432 ක මුදලක් එම ගොඩනැගිල්ල සඳහා උපකරණ මිල දී ගැනීමට වියදම් කර තිබූ බව නිරීක්ෂණය විය. | කටයුතු කිරීම වැදගත් බව කාරක සභාවේ අදහස විය. | | | | | |
| | **2019.09.18 දින සාකච්ජා කල කරුණු** | | | | | | |
| 14 | 2013 නොවැම්බර් 14 දින සිට 2015 මාර්තු 19 දින දක්වා මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ සේවය කල කළමනාකරණ අධ්‍යක්ෂවරයා 2014 ඔක්තෝම්බර් මස ගුරු දීමනා මුදල් රු. 900,000.00ක් ගුරුවරුන්ට නොගෙවා වංචා කර තිබීම. (NC/AP/C/ECA/3/15/42 | මෙම නඩුව දැනට විභාග වෙමින් පවතින බැවින් නඩු තීන්දුවක් ලැබී නොමැත | මු.රෙ.104(ප.මු.රී54) ප්‍රකාරව කටයුතු කිරීම සඳහා පහත කමිටුව පත් කර ඇත. B.M.R.ඒකනායක මහතා, ගණකාධිකාරී, පළාත් වාරිමාර්ග අමාත්‍යංශය- සභාපති M.G.S.ප්‍රේමචන්ද්‍ර මහතා, පරිපාලන නිලධාරී, පළාත් | කමිටු වාර්තාව මෙතෙක් ලබා දී නොමැත. මු.රෙ.104(ප.මු.රී54) ප්‍රකාරව කටයුතු කිරීම සඳහා නව කමිටුවක් පත් කර ඇත. සභාපති - M.G.ඉලංගසිංහ මයා,ස.ලේ(මුදල්),පළාත් කෘෂි.අමා. සාමාජික -H.M.චන්දිමා ජයවීර මිය. පරිපාලන නිලධාරී, පළාත් සංස්කෘතික දෙපා. | කිසිදු තොරතුරක් අධිකාරිය සතුව නොමැති වීමට හේතුව නිලධාරීන්ගේ නොසැළකිලිමත් බවයි යන්න සාකච්ජා විය. | පළාත් ප්‍රධාන අමාත්‍යංශ ලේකම් | 12 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2015.07.08) | | සංස්කෘතික දෙපා. - සාමාජික W.M.M.P.K.වික්‍රමසිංහ මහතා, පරිවාස නිලධාරි - සාමාජික | සාමාජික- W.M.M.P.K.වික්‍රමසිංහ මහතා, පරිවාස නිලධාරී මු.රෙ.104(3) වාර්තාව ලබා දීම ප්‍රමාදවීම හේතුවෙන් මු.රෙ.104(4) පරීක්ෂණය ආරම්භ වීම ප්‍රමාද වූ බවත්, පරීක්ෂණය කඩිනමින් නිම කර වාර්තාව ලබා දෙන බවත්, කමිටු චන්දිමා ජයවීර මිය ප්‍රකාශ කරන ලදී.<br>මෙයට අදාල නඩුව 2026.06.14 දිනට කැඳවා ඇති බව ප්‍රකාශ විය. | | | |

**04.** ප්‍රවර්තන රැස්වීමේ සාකච්ඡා කල නව කරුණු

| අනු අංකය | කාරණය | තීරණය | වගකිව යුතු නිලධාරියා |
|---|---|---|---|
| | **පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ හෙළිදරව් කිරීම්** | | |
| **04.1** | <u>01.ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල - </u> නිශ්කාර්යව පවතින වත්කම් ආසියානු සංවර්ධන බැංකු (ADB) ආධාර යටතේ හා Health Information and Quality Improvement ව්‍යාපෘතිය යටතේ රාජාංගනය යාය 11 ප්‍රාදේශීය රෝහල හා හිඟුරක්ගොඩ මූලික රෝහල වෙත පිළිවෙළින් 2024.11.13 දින හා 2025.07.26 දින ලැබී තිබූ පහත සඳහන් උපකරණ උපයෝජනයකින් තොරව ඇසුරුම් හෝ ඉවත් නොකොට ගබඩාවෙහි රඳවා ගෙන ඇති බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ජායාරූපද සහිතව පෙන්වා දෙන ලදී. | උතුරු මැද පළාත් සභාව යටතේ ඇති සියළු රෝහල්වල නිශ්කාර්යව පවතින මෙවැනි උපකරණවල ලැයිස්තුවක් සකස් කර ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග විමසා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කරන ලෙසත්, ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, උ.මැ.ප. |

| අනු අංකය | භාණ්ඩයේ නම | ප්‍රමාණය |
| --- | --- | --- |
| රාජාංගනය යාය 11 ප්‍රාදේශීය රෝහල | | |
| 01 | Printers | 06 |
| 02 | Monitor With Keyboard & Mouse | 11 |
| 03 | 650VA Line Interactive UPS | 12 |
| 04 | 1 KVA  Line Interactive UPS | 01 |
| 05 | 1 KVA  Online UPS | 02 |
| 06 | 2 KVA  Online UPS | 01 |
| 07 | 6X 13A Sockets PDU | 01 |
| 08 | Barcode Reader with stand | 06 |
| 09 | Barcode Printer YOKO MP6300 | 01 |
| 10 | Barcode Printer WINPAL W3COA | 04 |
| 11 | Token Printers WINPALWP260 | 02 |
| 12 | Laminating Machine | 01 |
| හිඟුරක්ගොඩ මූලික රෝහල | | |
| 13 | Barcode Reader | 83 |
| 14 | Printers | 43 |
| 15 | Computer Display Monitor | 90 |
| 16 | UPS | 44 |
| 17 | Key Lock for Desktop  & Laptop | 83 |
| 18 | Mouse pad | 43 |
| 19 | Adaptor | 84 |
| 20 | Laptop | 39 |
| 21 | Mouse | 39 |
| 22 | Back pack (Bag) | 39 |
| 23 | Power code | 27 |
| 24 | Epson Ink Bottle | 22 |
| 25 | Mount Bracket | 43 |

කමිටුවේදී විමසුම් කිරීම සඳහා එහි පිටපතක් තමා වෙත ලබා දෙන ලෙසත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී.

<table>
<tr><td></td><td>

| | | |
|---|---|---|
| 26 | Ribbon | 24 |

මෙම උපකරණ ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ Health Information and Quality Improvement ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදී ඇති උපකරණ බවත්, මෙම ව්‍යාපෘතියේ අරමුණ රෝගීන්ගේ රෝග තත්වයන් පිළිබඳ තොරතුරු පරිගණකගත කර වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කර තුන්ඩුවක් ලබා දීම වෙනුවට ලබා දිය යුතු ඖෂධ පිළිබඳ තොරතුරු පද්ධතියට ඇතුලත්කල පසු බෙහෙත් ලබා දීම එම පද්ධතිය පරීක්ෂා කර සිදු කිරීම දක්වා වූ අරමුණින් මෙම උපකරණ ලබා දී ඇති බවත්, මෙය දීපව්‍යාප්තව ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වුවත්, ඇතැම් රෝහල්වල මෙය ක්‍රියාත්මක වුවත්, ඇතැම් රෝහල්වල ක්‍රියාත්මක නොවී පවතින බව අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී. එසේම උපකරණ ලබාදුන් නමුත් වෛද්‍යවරුන් නොමැතිවීම ද මේ සඳහා බලපාන බවත් ප්‍රකාශ කරන ලද අතර, පහසුකම් නොමැතිවීම මත වෛද්‍යවරුන් නොපැමිණීම පිළිබඳ දීර්ඝ වශයෙන් කරුණු දක්වමින් උපකරණ නිශ්කාර්යව පැවතීම පම්බන්ධයෙන් විමසුම් නිකුත් කිරීමේදී ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙසද ඉල්ලා සිටින ලදී. මෙහිදී පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම ව්‍යාපෘතිය අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක කරන ලද්දක් වුවත් උපකරණ මිලදී ගැනීම එකවර සිදු කර ඇති නමුත් මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන වී නොමැති වීම පිළිබඳව ප්‍රකාශ කරමින් මේ පිළිබඳව රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් විමසිය යුතු බව ද ප්‍රකාශ කරන ලදී.

</td><td></td><td></td></tr>
<tr><td></td><td>

**02. රෝහල් සඳහා වෛද්‍ය හිගයක් පැවතීම**

රාජාංගනය යාය 11 ප්‍රාදේශීය රෝහලේ අනුමත කාර්ය මණ්ඩලය තුළ එක් දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි තනතුරක් ද ඇතුළුව වෛද්‍යවරුන් 04 දෙනෙක් අනුමතව ඇති නමුත් විගණනය විසින් පරීක්ෂාව සිදු කරන ලද 2026.05.14 දින වන විට රෝහලෙහි ආයතනභාර වෛද්‍ය නිලධාරී පමණක් වෛද්‍ය සේවයේ නිරතව සිටි බවත්, රෝහලෙහි සේවයේ නිරතව සිටි අනෙක් වෛද්‍යවරයා 2026.03.15 දින සිට විශ්‍රාම ගොස් ඇති අතර විශ්‍රාම යාමට පෙර 2026.02.01 දින සිට විශ්‍රාම පූර්ව නිවාඩු ද ලබා ගෙන ඇති බැවින් එදින සිට අඛණ්ඩව

</td><td></td><td>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, උ.මැ.ප.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | පැය 24 ම ආවරණය වන පරිදි ආයතනභාර වෛද්‍ය නිලධාරී විසින් තනිවම රෝහලෙහි බාහිර රෝගී අංශයේ රෝගීන් පරීක්ෂා කිරීම, ළමා හා මාතෘ සායන, වෛද්‍ය සායන, බෝ නොවන රෝග සායන මෙන්ම නේවාසික රෝගීන් පරීක්ෂා කිරීම යන සියළුම කටයුතු සිදු කරනු ලබන බවත්, ඒ අනුව 2026 පෙබරවාරි හා මාර්තු යන මාසවලදී පිළිවෙළින් රෝගීන් 6007 ක් හා 5829 ක් මෙකී වෛද්‍යවරයා විසින් තනිවම පරීක්ෂාවට භාජනය කර ඇති බවත් ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කරන ලදී. මේ සදහා පළාත් සභා මට්ටමින් පිළිතුරු දිය නොහැකි නමුත් පවතින තත්වය පිළිබදව දැනුවත් කිරීම සදහා ඉදිරිපත් කල බව ද ඇය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.<br>මෙම රෝහල පමණක් නොව නැගම්පහ රෝහලේ තත්වයද මෙවැනිම බව පෙන්වා දෙමින් වෛද්‍ය හිගය මගහරවා ගැනීමට ගන්නා ලද උත්සාහයන් පිළිබදව අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී.<br>මෙහිදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) විසින් අයවැය ඇස්තමේන්තු අනුව පළාත තුල වෛද්‍යවරුන් 34 දෙනෙකුගේ අතිරික්තයක් පෙන්වන බව ප්‍රකාශ කල අතර, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් ද ඇතැම් රෝහල්වල(තඹුත්තේගම වැනි පහසුකම් වැඩි රෝහල්වල) වෛද්‍ය අතිරික්තයක් පවතින බව සඳහන් කරන ලදී. | | |
| | **03. හිඟ වවුචර පිළිබද පසු විපරම් පරීක්ෂාව**<br>අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2023 ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා කාලයට අදාළ වවුචරපත් පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු අංක NCP/IA/03/PDHS/26/24-78 හා 2024.10.30 දිනැති විගණන වාර්තාව මගින් ඉදිරිපත් කල බවත් එම වාර්තාව මගින් පෙන්වා දෙනු ලැබූ හිඟ වවුචර 248 අතුරින් නැවත සොයා ගෙන විගණනය වෙත ඉදිරිපත් කළ වවුචර සම්බන්ධයෙන් සිදු කරන ලද පසු විපරම් පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය වූ බවත් ප්‍රකාශ කරමින් විගණන වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ මාස 03 ක වවුචර්පත් පරීක්ෂාවකින් බවත්, එම වසරේ ඉතිරි මාස නමයේ සහ ඉන් අනතුරුව එළඹි වර්ෂවල මෙවැනි තත්වයන් වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කරගෙන ඇත්ත | පරීක්ෂණයේ වාර්තාව කඩිනම් කර ලබා ගන්නා ලෙස දන්වන ලදී. | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, උ.මැ.ප./අ/පුර ප්‍රා.සෞ.සේ.අ |

| | | | |
|---|---|---|---|
| | යන්න පිළිබඳ තහවුරු කර ගැනීමට එකම ආයතනය සෑම වසරකදීම විගණනය කිරීමට හැකියාවක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.<br>I. හිඟ වවුචර 248 ක ප්‍රමාණයෙන් නැවත සොයා ගන්නා ලද වවුචර 231 ක් ද, අස්ථානගත වවුචර 15 ක් සඳහා අනුපිටපත් වවුචර ද සකස් කර මුළු වවුචර 246 ක ප්‍රමාණයක් විගණනය වෙත ඉදිරිපත් කර තිබූ අතර, තවදුරටත් වවුචර 02 ක ප්‍රමාණයක් හිඟව පැවතීම.<br>II. අනුපිටපත් වවුචර 15 නියමිත පරිදි සකස් කර නොතිබීම.<br>III. මුල් වවුචර නොමැති වවුචර 08 ක් සඳහා ඡායාපිටපත් ඉදිරිපත් කර තිබීම.<br>IV. වවුචර 25 ක් සඳහා වියදම සනාථ කිරීමට අදාළ සනාථන ලියවිලි ඉදිරිපත් කර නොතිබීම.<br>V. මිලදී ගැනීම් වලට අදාළ වවුචර 25 ක් පැවති අතර මෙකී මිලදී ගැනීම් වලට අදාළ ප්‍රසම්පාදන කමිටු තීරණ හා තාක්ෂණික ඇගයීම් කමිටු තීරණ හෝ ඒ සඳහා නිසි බලධාරීන්ගෙන් ලබා ගත් අනුමැතීන් ඇතුළත් ලිපි ලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීම.<br>VI. අත්තිකාරම් ගෙවීම් කිරීමට අදාළ වවුචර 19 ක් අතුරින් වවුචර 14 ක් සඳහා අත්තිකාරම් පියවීම් වවුචර ඉදිරිපත් කර නොතිබීම.<br>VII. ගෙවීම් ලබන්නා විසින් අත්සන් කර නොමැති වවුචර 10 ක් පැවතීම.<br>VIII. ගෙව්වා යන මුද්‍රාව තබා නොමැති වවුචර් 29 ක් පැවතීම.<br>IX. පරීක්ෂා නොකරන ලද වවුචරපත් 41 ක් පැවතීම.<br>X. උපලේඛනයක් මගින් ගෙවීම් කර තිබුණු වවුචර 48 ක, උපලේඛනයෙහි මුදල් ලබන්නාගේ අත්සන් නොමැති වීම.<br><br>ඉහත තත්වය සැළකිල්ලට ගෙන සෑම ආයතනයක්ම තම ආයතනයේ වවුචර් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට සැළකිල්ල යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.<br>අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලද්දේ මේ වන විට ගෙවූ වවුචර්පත් සියල්ල නිසි පරිදි සකස් කර පවත්වාගෙන යන බවත් විගණනය විසින් පෙන්වා දෙන ලද ගැටළුකාරී තත්වය | | |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් වගකිව යුතු අයට සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත් ඒ සඳහා දැනට පරීක්ෂණයක් පැවැත්වෙන බවත් ප්‍රකාශ කරන ලදී. | | |
| | **04. අධීක්ෂණය දුර්වල වීම මත ආයතනවල අභ්‍යන්තර පාලනය ගිලිහී යාමෙන් ගැටළු පැන නැගී තිබීම.**<br><br>මෙම කරුණ යටතේ අදහස් කරන්නේ ආයතනවල දැනටත් විධිමත් පරිදි නිවාඩු අයදුම්පත් ඉදිරිපත් නොකිරීම, පැමිණීම හා පිටවීම නිවැරදිව සිදු නොවීම, නිවාඩු, තැපැල ප්‍රමාදවීම වැනි අභ්‍යන්තර පාලන ක්‍රමවල පවතින දුර්වලතා හේතුවෙන් නිරන්තර පෙත්සම් ලැබීමේ තත්වයක් පවතින බවත්, මෙවැනි කරුණු විගණනයකදී පරීක්ෂා කිරීමට වඩා සෑම ආයතනයකම මාසික කාර්ය මණ්ඩල රැස්වීම්වලදී හෝ මෙවැනි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පිළිබඳ සාකච්ඡා කිරීමට අවධානය යොමු කිරීමෙන් නිවැරදි කර ගැනීමට අවධානය යොමු කරන ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ඉල්ලා සිටින ලදී. | | සියළුම ආයතන ප්‍රධානීන් |
| | **05.** අභ්‍යන්තර විගණන වාර්තා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්/ගණන් දීමේ නිලධාරීන් වෙත යොමු කරන බැවින් එම වාර්තා සඳහා පිළිතුරු ලබා දීම ඔවුන් විසින් සිදු කල යුතු වුවත් ඇතැම් අවස්ථාවල විගණනය සිදුකරන ලද ආයතනයෙන් පිළිතුරු ඉදිරිපත් කරන අවස්ථා පවතින බවත්, ඇතැම් අවස්ථාවල විගණනය සිදුකරන ලද ආයතනයෙන් ලබා දෙන පිළිතුර ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්/ ගණන් දීමේ නිලධාරීගේ නිරීක්ෂණ රහිතව විගණනය වෙත යොමු කරන අවස්ථා පවතින බවත් ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් පෙන්වා දෙන ලදී. මේ හේතුවෙන් විගණිත ආයතනයේ පවතින අභ්‍යන්තර පාලන දුර්වලතා හා ඒවා නිවැරදි කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්/ගණන් දීමේ නිලධාරීගේ අවධානය යොමු නොවන බැවින් විගණන වාර්තා සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්/ගණන් දීමේ නිලධාරී විසින්ම පිළිතුරු ලබා දිය යුතු බව වැඩිදුරටත් සඳහන් කරන ලදී. | | සියළුම ආයතන ප්‍රධානීන් |
| | 06. කළාප අධ්‍යාපන කාර්යාලවල Payroll පරිගණක වැටුප් වැඩසටහන සඳහා භාවිතා කරන පරිගණකවල ගැටළු පැවතීම සම්බන්ධයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක කරුණු පැහැදිලි කරන ලදී. | දැනට නව වැටුප් පරිගණක වැඩසටහනක් සඳහා ප්‍රසම්පාදනයක් සිදු වෙමින් පවතින නමුත් එය | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |

| | | | |
|---|---|---|---|
| | | ස්ථාපිත කිරීමට යම් කාලයක් ගත විය හැකි බව සාකච්ජා විය. පවතින ගැටළු තත්වය පිළිබඳ භාණ්ඩාගාරය දැනුවත් කිරීම සුදුසු බව දන්වන ලදී. | |
| | 07. අංක 54/2023 චක්‍රලේඛය පාසැල් තුල ක්‍රියාත්මක නොවීම හා ඇතැම් පාසැල්වල විදුහල්පතිවරුන් හා භාණ්ඩාගාරිකවරුන් ඒ පිළිබඳ දැනුවත් නොවීම සම්බන්ධයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක කරුණු පැහැදිලි කරන ලදී. ඒ අනුව කමිටු ක්‍රියාත්මක නොවීම, මුදල් පොත් ලිවීම අවිධිමත්වීම හා බැංකු ප්‍රකාශය ලද පසුව එහි ඇතුලත් ලැබීම් හා ගෙවීම් මුදල් පොතේ සටහන් කිරීම, වවුචර්පත්වල ගෙවීම් අනුමත කිරීම, වියදම සහතික කිරීම සිදු නොකිරීම යන කරුණු හෙළිදරවු කරන ලදී.<br>එසේම පාසැල්වල බඩු වට්ටෝරු පොත්වල පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ඇතුලත් කර පැවති අවස්ථා නිරීක්ෂණය වූ නමුත් භාණ්ජ සමීක්ෂණයේදී ඒ බව හඳුනාගෙන වාර්තා කර නොතිබූ බැවින් භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිවැරදිව සිදු නොවන බව නිරීක්ෂණය වන බව ද ප්‍රකාශ කරන ලදී.<br>ගුරුභවතුන් හා විදුහල්පතිවරුන් නිරන්තරයෙන් පුහුණුවීම් සිදු කර ඇති බව අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(මුදල්) විසින් ප්‍රකාශ කල අතර, නැවත ඉදිරියේදී පුහුණුවීම් පැවැත්වීමට සැළසුම් කර ඇති බව ද ප්‍රකාශ කරන ලදී. | පුහුණුකල බවට වාර්තාවන ක්‍රමයක් (පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව හා අදාල ආයතන වෙත) සකස් කර ක්‍රියාත්මක කරන ලෙසත්, පාසැල් අධීක්ෂණයේදී මෙම කරුණු පරීක්ෂාවට භාජනය කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙසත් දන්වන ලදී. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |
| | 08. පාසැල්වල සිටින යම් යම් රෝගාබාධවලින් පෙළෙන ගුරුවරුන් වෙත ඉගැන්වීම් සිදු කිරීම සඳහා කාලච්ඡේද ලබා නොදී තබා ගැනීම හේතුවෙන් කාර්ය සාධනය ඇගයීම සම්බන්ධයෙන් ගැටළු පැවතීම<br>උදා - ගලෙන්බිඳුණුවැව කළාප අධ්‍යාපන කාර්යාලය | එවැනි ගුරුභවතුන් වෙත විෂය බාහිර ක්‍රියාකාරකම් වැනි දෑ පවරා ඒ අනුව කාර්ය සාධනය ඇගයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව සාකච්ජා විය.<br>එසේම මානසික ගැටළු සහිත අය සමග ගනුදෙනු කල යුතු ආකාරය සම්බන්ධව ඊට අදාල වෛද්‍යවරුන් මගින් විදුහල්පතිවරුන් වෙත පුහුණු වැඩමුවවක් පැවැත්වීම සුදුසු බව ද සාකච්ජා විය. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |

| | | | |
|---|---|---|---|
| | 09. කළාප අධ්‍යාපන කාර්යාල අතර ගුරුභවතුන්ගේ පුද්ගලික ලිපිගොණු හුවමාරුවීමේ ප්‍රමාදයන් පැවතීම හා<br>* පුද්ගලික ලිපිගොණු යාවත්කාලීන නොවීම<br>* සකස් කර ඇති ඇතැම් වැටුප් පරිවර්ථන දෝශ සහගත වීම.<br>* ඉහත හේතූන් මත නිරන්තරයෙන් හිග වැටුප් පැවතීම<br>මෙම අඩුපාඩු හේතුවෙන් ගරුභවතුන් විශ්‍රාම යෑමේදී ගැටළු රාශියකට මුහුණු පෑමට සිදුවී ඇති බව ප්‍රධාන අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලද අතර, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේද මෙම තත්වය පවතින බව ප්‍රකාශ කරන ලදී.<br>ප්‍රමාණවත් කාර්ය මණ්ඩල නොමැතිවීම මේ සඳහා හේතු වී ඇති බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී. | කළමණාකරන සේවා නිලධාරීන් බඳවා ගැනීමට නැවත අනුමැතිය ඉල්ලා යැවීමට සාකච්ජා විය. | නි.ප්‍ර.ලේ(පාලන) |
| | 10. උතුරු මැද පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන බොහෝ සංවර්ධන ව්‍යාපෘති, විධිමත් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව යෝජනා වීම හේතුවෙන්, සංවර්ධන සැලසුම් නිරන්තරයෙන් සංශෝධනය වීමත්, ඒ හේතුවෙන් ඇතැම් ව්‍යාපෘති අවිච්ඡේද හෝ අවලංගු වීමත් සිදු වන බැවින් පළාතට ලැබෙන සීමිත අරමුදල් ව්‍යාපෘති සඳහා ඵලදායි ලෙස ආයෝජනය නොවී නිශ්ක්‍රිය වීමක් සිදු වන බව ප්‍රධාන අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදී. මෙම තත්ත්වය තුළ 2025 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගත් ව්‍යාපෘතින් නිසි පරිපාලන ක්‍රියාවලීන් සහ හේතු සාධක ඉදිරිපත් කිරීමකින් තොරව අවලංගු කිරීම, විෂය පථ වෙනස් කිරීම හෝ ප්‍රතිපාදන සංශෝධනය කිරීම වැනි දැඩි වෙනස්කම්වලට භාජනය කර ඇති බවත්, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ඇතැම් ව්‍යාපෘතිද අසාර්ථක ව්‍යාපෘතින් බවට පත්ව ඇති බව ද ප්‍රකාශ කරන ලද අතර, මෙම සමස්ත තත්ත්වය උතුරු මැද පළාත් සභාවේ සැලසුම්කරණයේ දුර්වලතාවය සහ මූල්‍ය විනය නොමැතිකම පෙන්නුම් කරන බව ද ප්‍රකාශ කරන ලදී.<br>අනුමත සංවර්ධන ව්‍යාපෘති පසුව සංශෝධනය කරගනු ලැබුවද, සංශෝධිත ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන සැළැස්ම හා ක්‍රියාකාරී සැළැස්ම සංශෝධනය කර නොගැනීම ද ඇය විසින් පෙන්වා දෙන ලදී. | මෙම වර්ෂය මුලදී ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර වාර්තාවක් ප්‍රධාන ලේකම්ගේ අත්සනින් ඉදිරිපත් කල බවත්, සෑම දෙපාර්තමේන්තුවක් හා අමාත්‍යාංශයක් විසින්ම සෑම මාසයකට වරක් ප්‍රගති සමාලෝචනයක් සිදු කරන ලෙසට චක්‍රලේඛයක් මගින් දැනුම් දී ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැළසුම්) විසින් ප්‍රකාශ කරන ලද අතර, ඒ අනුව දැනට දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා අනතුරුව ප්‍රධාන ලේකම් සමග ද සාකච්ජාවක් පවත්වන ලද බව ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. | නි.ප්‍ර.ලේ(සැළසුම්) |

| | | | |
|---|---|---|---|
| | | ජනාධිපති ලේකම් කාර්යාලය මගින් නිලධාරීන්ගේ කාර්ය සාධනය මාර්ගගත ක්‍රමය ඔස්සේ ඇගයීම සඳහා කටයුතු කෙරෙමින් පවතින බව කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කරන ලදී. | |
| | 11. පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ 2025 වර්ෂයේ වෙන් කරන ලද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) උපයොජනය කර ක්‍රියාත්මක කිරීමට, කැකිරාව, තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. 3,000,000.00 ක මුදලක් වෙන් කොට තිබූ බවත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා තිබූ බවත් ප්‍රධාන අභ්‍යන්තර විගණක ප්‍රකාශ කල අතර, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාලව පහත කරුණු නිරීක්ෂණය වූ බව ද ප්‍රකාශ කරන ලදී.<br>I. කැකිරාව ප්‍රාදේශීය විසින් රු. මිලියන 4.2 ක ඇස්තමේන්තුවක් සැකසීම<br>II. මාස 2 1/2 කට පසුව ප්‍රතිපාදන සීමාව රු. මිලියන 3 බැවින් ඒ සඳහා නැවත ඇස්තමේන්තුවක් ලබා ගැනීම(civil cost 2.2 m)<br>III. ඉංජිනේරු දෙපාර්තමේන්තුව කාර්ය බහුල බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මෙම ව්‍යාපෘතිය පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දීම<br>IV. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් ඇස්තමේන්තුවේ ඇතුලත් අයිතම කිහිපයක සම්මත රේටයන් ඉක්මවා ඊට වැඩි රේටයන් ඇතුලත් කර ඇස්තමේන්තුවක් සැකසීම(civil cost 2.53 m)<br>V. වැඩ අවසන් කල යුතු දිනය 2025.12.14 ලෙස දක්වා ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සමග ගිවිසුම් ගත වුවද 2025.12.16 දින මෙම ව්‍යාපෘතිය උප කොන්ත්‍රාත් ලබා දීම ( රු.මි.1.9)<br>VI. ඇස්තමේන්තුවේ අංක 5.2 හි සඳහන් අයිතමයට රු.49,755.60 ක මුදලක් වැඩිපුර ගෙවීම | වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවන බව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.<br>පළාත් සභාවේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති ඉටු කල පසු ප්‍රමාණවත් කාලයක් හා පහසුකම් පවතින්නේ නම් පමණක් මෙවැනි ව්‍යාපෘති ඉටු කල යුතු බව සාකච්ජා විය. | සාමාන්‍යාධිකාරී,<br>ප.මා.සං.අධිකාරිය |

| | | | |
|---|---|---|---|
| | VII. තත්ව පාලන වියදම් ගෙවීමේ ගැටළු පැවතීම.<br>ඇස්තමේන්තු වට්නාකම | | |

**04.2 විගණකාධිපති විගණන විමසුම් මගින් හෙළිදරවු කල විශේෂ කරුණු හා ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ**

I. ජාතික විගණන කාර්යාලයෙන් නිකුත් කරන ලද විගණන විමසුම්වලට 2026 ජූනි 10 දින දක්වා පිළිතුරු ලබා දීමේ ප්‍රගතිය.

| අනු අංකය | ආයතනය | විගණන විමසුම් අංකය | කාරණය | නිකුත් කළ දිනය |
|---|---|---|---|---|
| ------ | ------------------ | -------------------------- | ------------------------------ | ------------ |
| 1. | ප්‍රධාන ලේකම් කාර්යාලය (02) | NCPC/AN/F/DECMA/CM/2025/12 | උතුරු මැද පළාත් සභා සංකීර්ණයෙහි ආරක්ෂක සේවාව සපයා ගැනීම පිළිබඳ පරීක්ෂාව. | 2025/08/27 |
| 2. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය (02) | NCPC/AN/F/PRDA/2026/01 | 2026 වර්ෂයට ප්‍රති ඇණවුම් මත තාර (80/100 ) බැරල් මිළදී ගැනීම පිළිබඳ පරීක්ෂාව. | 2026/02/17 |
| | | NCPC/AN/F/PRDA/2026/02 | පළාත් මාර්ග සංවර්ධනය කිරීම පිළිබදව හා විධායක ඉංජිනේරු කාර්යාල පිළිබඳ සෝදිසි විගණන පරීක්ෂාව - 2025 | 2026/03/24 |

විගණන විමසුම් එකින් එක පිළිබද විමසීමට බලාපොරොත්තු නොවන බවත්, පිළිතුරු ලබා දී නොමැති සියළු විමසුම් සඳහා පිළිතුරු ලබා දෙන ලෙසත් දන්වන ලදී.

මීලග විගණන කමිටුවේ සිට හිහ විගණන විමසුම් එකින් එක සඳහා පිළිතුරු ලබා දෙන දිනය සටහන් කිරීමට කටයුතු කල යුතු බවද සාකච්ඡා විය.

අදාල ආයතන ප්‍රධානීන්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | 3. | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (12 ) | NCPC/C/PDHS/2025/A,B/AQ-01 | තලාව ප්‍රාදේශීය රෝහල, කාර්යසාධන විගණන පරීක්ෂාව - 2024 | 2025.01.22 | | |
| | | | | NCPC/AN/C/PDHS/2025/AQ-08 | 2024 වර්ෂයේ අවසන් දින කිහිපය තුළ දී කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීම සම්බන්ධව පරීක්ෂාව | 2025.02.13 | | |
| | | | | NCPC/C/PDHS/2025/C/AQ-09 | විලච්චිය ප්‍රාදේශීය රෝහලේ දන්ත වෛද්‍ය විවේක කාමරය අලුත්වැඩියාව පිළිබඳ පරීක්ෂාව - 2025 | 2025.02.11 | | |
| | | | | NCPC/C/PDHS/2025/A/AQ-12 | මැදවච්චිය මූලික රෝහලේ CSSD යන්ත්‍රය සවිකිරීම සඳහා ස්ථානයක් සකස් කිරීම පිළිබඳ විගණන පරීක්ෂාව - 2025 | 2025.03.11 | | |
| | | | | NCPC/C/PDHS/2025/A/AQ-14 | තම්මැන්නාපුර සායන මධ්‍යස්ථානයේ වැඩිදියුණු කිරීම පිළිබඳ විගණන පරීක්ෂාව - 2025 | 2025.03.11 | | |
| | | | | NCPC/AN/C/PDHS/2025/A/AQ-15 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මිල දී ගැනීම් පරීක්ෂාව - 2024 | 2025.05.16 | | |
| | | | | NCPC/C/RDHS/2024/C/AQ-16 | අංක 227 – 4204 දරන ලොරි රථය විගණන පරීක්ෂාව | 2024.05.10 | | |
| | | | | NCPC/AN/C/PDHS/2025/A,B/AQ-39 | තඹුත්තේගම මූලික රෝහල, කාර්යසාධන විගණන පරීක්ෂාව - 2025 | 2026.01.08 | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | NCPC/AN/C/PDHS/2025/A,B/AQ-41 | මැදවච්චිය මූලික රෝහල, කාර්යසාධන විගණන පරීක්ෂාව - 2025 | 2026.01.14 | | |
| | | | NCPC/AN/C/PDHS/2025/A,B/AQ-46 | කැකිරාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, මූල්‍ය හා කාර්යසාධන විගණනය - 2025 | 2026.03.19 | | |
| | | | NCPC/AN/C/PDHS/2026/A,B/AQ-08 | උතුරු මැද පළාතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල ජල සාම්පල් පරීක්ෂාව - 2025 | 2026.03.19 | | |
| | | | NCPC/AN/C/PDHS/2025/A,B/AQ-05 | උතුරු මැද පළාත් වකුගඩු රෝග පරීක්ෂාවන්ට අදාළ දත්ත සැකසුම් මෘදුකාංග පද්ධතිය (LIMS) විගණනය - 2026 | 2026.03.30 | | |
| | 4. | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | NCPC/PL/A/RDHS/26AQ/B,C,D/04 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කායීලවල LIMS පද්ධති පරීක්ෂාව | 2026/02/24 | | |
| | 5. | අධ්‍යාපන දෙපාර්තමේන්තුව (09) | NCPC/PL/A/ZEDG/26/AQ/D/09 | දිඹුලාගල කලාප අධ්‍යාපන කායීලය - විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට වැටුප් ගෙවීම පරීක්ෂාව | 2026/05/06 | | |
| | | | NCPC/AN/B/EDU/2025/27(II) | අ/නො/ පහළ මාරගහවැව විද්‍යාර්ථ මහ විදුහලේ පරිගණක හා ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකවල දොර අගුලු කඩා එහි තිබුණු පරිගණක | 2025/07/31 | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | උපාංග සොරා ගැනීමෙන් රු. 224,600 ක අලාබයක් සිදුවීම සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් සිදුකර නොතිබීම. - 2025 | | | |
| | | | | NCPC/AN/B/EDU/2025/37 | කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලයේ මූල්‍ය හා කාර්ය සාධන විගණනය - 2025 | 2025/09/19 | | |
| | | | | NCPC/AN/B/EDU/2025/44 | කැබිතිගොල්ලෑව මධ්‍ය මහා විද්‍යාලයේ සෝදිසි විගණන පරීක්ෂාව -2025 | 2025/10/27 | | |
| | | | | NCPC/AN/B/EDU/2025/48 | කැකිරාව කලාප අධ්‍යාපන කාර්යාලය - සෝදිසි විගණන පරීක්ෂාව - 2025 | 2026/02/25 | | |
| | | | | NCPC/AN/B/EDU/2025/50 | උතුරු මැද පළාතේ සිසුන් දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය භාවිතා කරන බව සනාථ කිරීමට විධිමත් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන නොතිබීම | 2026/02/16 | | |
| | | | | NCPC/AN/B/EDU/2026/02 | 2025 වර්ෂයේ PSDG ප්‍රතිපාදන වලින් අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් වල | 2026/03/24 | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂාව. | |
| | | NCPC/AN/B/EDU/2026/04 | අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලය - සෝදිසි විගණන පරීක්ෂාව - 2026 | 2025/02/25 |
| | | NCPC/AN/B/EDU/2026/11 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (jemp) -2025 වර්ෂයේ වියදම් පරීක්ෂාව | 2025/05/18 |
| 06 | ප්‍රධාන අමාත්‍යාංශය | NCPC/AN/B/CM/2026/08 | PSDG ව්‍යාපෘතියේ (සූර්ය වීදි ලාම්පු සවි කිරීම) සංචාරකයින් දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම, හිරිවඩුන්න වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම. | 2026/04/22 |

| | | | |
|---|---|---|---|
| | **II. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැසමේ ප්‍රගතිය**<br>- 2026 වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂිත විගණන පරීක්ෂණ - 156 කි.<br>- 2026 පළමු හා දෙවන කාර්තුව තුළ ඉටු කිරීමට අපේක්ෂිත විගණන පරීක්ෂණ - 82 කි.<br>- 2026.06.10 දින වන විට ඉටු කර ඇති විගණන පරීක්ෂණ ගණන - අභ්‍යන්තර විගණන අංශය මඟින් ඉදිරිපත් කරනු ඇත.<br>මෙම කරුණ විගණන කමිටුවට ඉදිරිපත් කිරීමට හේතු ලෙස ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලද්දේ පසුගිය දිනක රාජ්‍ය ගිණුම් කාරක | - මෙහිදී ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කරන ලද්දේ පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව සඳහා අනුමත විගණන කාර්ය මණ්ඩලය 25 ක් බවත්. ඒ අතුරින් දැනට සේවයේ යෙදී සිටින්නේ නිලධාරීන් 15 දෙනෙකු පමණක් බවත් විගණනය කිරීමට ඇති ආයතන සංඛ්‍යාව හා සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණය අනුව මෙම කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බවත්ය. එසේම දැනට අනුමත කාර්ය මණ්ඩලය තුල ඇති අභ්‍යන්තර විගණන නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගැනීමට ඉල්ලීම් යොමු කර ඇති බව ද ප්‍රකාශ කරන ලදී. | ප්‍ර.අ.වි. |

| | | | |
|---|---|---|---|
| | සභාවේ සභාපතිගේ සහභාගීත්වයෙන් පැවති රැස්වීමකදී විවිධ නිලධාරීන් ගිණුම් කාරක සභාව හමුවට කැදවා කරුණු විමසීම් කර මාධ්‍ය මගින් ප්‍රචාරය කරනු ලැබුවත් කිසිදු සංවර්ධනයක් නොවන තත්වයක් පවතින බැවින් අභ්‍යන්තර විගණනය ජාතික විගණනයට සහය වන අන්දමින් පිහිටුවිය යුතු බවත්, එහිදී අභ්‍යන්තර විගණනය නිවැරදිව සිදුවීමට නම් එය දීප ව්‍යාප්ත සේවයක් ලෙස ආරම්භ කිරීමට යෝජනා වී ඇති බව සාකච්ජා වූ බවත් ප්‍රකාශ කරන ලදී. එසේම එහිදී විගණන හා කළමනාකරණ කමිටු ශක්තිමත් කර සියළු ගැටළු එම කමිටුවේදී විසදා ගැනීමට කටයුතු කිරීමෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාවට ඉදිරිපත්වන ගැටව අවම කර ගත යුතු බව ද ප්‍රකාශ කල බැවින් අභ්‍යන්තර විගණනයේ සැළැස්ම මෙම කමිටුවේදී සමාලෝචනය කිරීම සඳහා මෙම කරුණ ඉදිරිපත් කල බව ද ප්‍රකාශ කරන ලදී. | - අභ්‍යන්තර විගණන නිලධාරී කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීම සඳහා යෝජනාවක් සකස් කර ඉදිරිපත් කරන ලෙසත්, එහි පිටපතක් තමා වෙත ද ලබා දෙන ලෙසත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කරන ලදී. | |
| | III. ආදායම් ගණන්දීමේ නිලධාරීන්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම - ආදායම් ගණන්දීමේ නිලධාරී විසින් ඉදිරිපත් කරනු ලබයි.<br>විගණන හා කළමනාකරණ කමිටු චක්‍රලේඛයේ ආදායම් ගණන්දීමේ කමිටු පවත්වන ලෙස දක්වා ඇතත් එම කමිටු නොපැවැත්වෙන බව ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. | පළාත් භාණ්ඩාගාරයේ විගණන හා කළමනාකරණ කමිටුවේදී ආදායම් සම්බන්ධ කරුණු සාකච්ජා කරන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) විසින් ප්‍රකාශ කල අතර, පළාත් සමූපකාර අමාත්‍යාංශ 2026 දෙවන විගණන කමිටුවේදී ද ආදායම් සම්බන්ධව සාකච්ජා කල බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කරන ලදී.<br>ආදායම් සම්බන්ධයෙන් අදාල ආයතන වෙනමම විගණන කමිටු පැවැත්වීම සුදුසු බවත්, එසේ නොමැති නම් අදාල දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ විගණන කමිටුවලදී හෝ මෙම කරුණ සාකච්ජා කල යුතු බවත් ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.<br>පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ බදු අය කිරීමේ ප්‍රගතිය මෙන්ම බදු අනුමැතිය දීමේ ප්‍රගතිය ද සාකච්ජාවට ගත යුතු බව දන්වන ලදී. | සියළුම ආදායම් ගණන් දීමේ නිලධාරීන් |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| IV. | රාජ්‍ය ආයතනවල වහල මත සූර්ය පැනල සවිකිරීමේ ව්‍යාපෘතිය පරික්ෂාව | | | | | | |
| | ව්‍යාපෘතිය<br>------------- | ව්‍යාපෘති<br>කාලය<br>----------------<br>- | අපේක්ෂිත<br>වොට් ප්‍රමාණය<br>--------------- | ලබාගත්<br>ප්‍රමාණය<br>--------- | අහිමි ආදායම<br>---------------- | | නි.ප්‍ර.ලේ.(මුදල්)/ප්‍රධාන ඉංජිනේරු/ප.අධ්‍යාපන අධ්‍යක්ෂ/ප.සෞ.සේ. අධ්‍යක්ෂ |
| **01** | **පළාත් භාණ්ඩාගාරය** - උතුරු මැද පළාත් සභාවේ පාසල්, රෝහල් හා කාර්යාල ගොඩනැගිලිවල සූර්යය විදුලි උත්පාදන පද්ධති සවි කිරීම. (GAIA Greenegy NCP (PVT) Limited)<br>ඇස්තමේන්තු ආයතන ගණන - 836<br>නිමකළ ආයතන ගණන - 144 | 2022.02.15 සිට 2026.06.12 දක්වා | ඉදිකිරීමට අපේක්ෂිත - 46.2MWH | ඉදිකර ඇති - 10 MWH | 2024 - 4,718,936<br>2025- 14,466,022<br>-------------<br>19,984,958<br>========= | 2021 වර්ෂයේ ආරම්භ කල ව්‍යාපෘතියක් බවත්, වහල බදු දීම මගින් පළාත් සභාවට 16.2% ක් ද, තැන්පතු ලෙස .8% කද ඉතිරිය අදාල සමාගමේ ආදායමක් ලෙසද මෙය ආරම්භ කර ඇති බව නි.ප්‍ර.ලේ(මුදල්) විසින් ප්‍රකාශ කල අතර, මුල් අවස්ථාවේ කොවිඩ් තත්වය හේතුවෙන් හා ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවූ බවත් වර්ථමානය වන විට MWH 11 ප්‍රමාණයක් සම්පූරණ කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) විසින් ප්‍රකාශ කල අතර, දැනට නව සූර්යය විදුලි | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | පද්ධති සවි කිරීම රජය විසින් සීමා කර ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කිරීමට සිදුවිය හැකි බව ද ප්‍රකාශ කරන ලදී.<br>සූර්ය පැනල සවි කිරීම හේතුවෙන් හානි වී ඇති පාසැල්වල වහල අළුත්වැඩියාවන් සිදු කරන ආකාරය පිළිබඳවත්, එම පද්ධතිවල ඉදිරි සේවාවන් සිදු කරන ආකාරය පිළිබදවත්, වාර්තාවක් ලබා ගන්නා ලෙසත් ජො.ස.වි. ප්‍රකාශ කරන ලදී. | |
| 02 | උතුරු මැද පළාත් පරිපාලන සංකීර්ණයේ වහලය මත සවි කර ඇති සූර්යය විදුලි උත්පාදන පද්ධතිය | 2019 සිට 2020 | මාසිකව 16.998 KWH | මාසිකව 5645 KWH | 2024- දක්වා 21,000,000 | මෙම සූර්යය විදුලි උත්පාදන පද්ධතිය මගින්ද ආරම්භයේදී බලාපොරොත්තු වී ඇති උත්පාදනය සිදුවී නොමැති බව ජො.ස.වි. ප්‍රකාශ කරන ලදී.<br>ආරම්භක කාල වකවානුවේදී ප්‍රමාණවත් අධීක්ෂණයක් වී නොතිබීම මත 2020 වැනි කාලයේදී විදුලි උත්පාදනයේ බිදවැටීමක් වී ඇති නමුත් 2023/2024 කාලයෙන් පසු ගැටළුවකින් තොරව විදුලි උත්පාදනය සිදුවන බව පළාත් ඉංජිනේරු | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලදී. | |
| | **03** | **පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තු** ගොඩනැගිල්ලේ වහලය මත සවි කර ඇති සූර්යය විදුලි උත්පාදන පද්ධතිය | | | 2024 දක්වා 9,000,000 | මේ වන විට දෛනිකව ඒකක 60 දක්වා උත්පාදනය වන බවත්, එහි අධීක්ෂණය ප්‍රමාණවත් අයුරින් සිදු කරන බවත්, පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලදී. | |
| | **04** | **පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** ප්‍රධාන අමාත්‍යාංශය මඟින් නිම කළ ව්‍යාපෘති - 12<br>GAIA ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ ප්‍රමාණය - 988<br>GAIA ව්‍යාපෘතියෙන් සම්පූර්ණ කළ ප්‍රමාණය - 144<br>GAIA ව්‍යාපෘතියෙන් අසම්පූර්ණ ගණන - 23 | | | | | |
| | **05** | **පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** -RHSD වහලය - පළාත් සභා අරමුදල් | 2025 | 40 KWH | 2025 ජනවාරි මාසයේ වැඩ අවසන් කර තිබුණ ද, 2025 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම පද්ධතිය | මෙම පද්ධතිය විදුලිබල මණ්ඩලයේ මධ්‍යම විදුලිබල පද්ධතියට මෙතෙක් | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | විදුලිබල මණ්ඩලයේ මධ්‍යම විදුලිබල පද්ධතියට සම්බන්ධ කර නොතිබුණි. | සම්බන්ධ කර නොමැති බව සාකච්ඡා විය. | |
| | - තඹුත්තේගම රෝහල | 2018 | 20 KWH | 2018 වර්ෂයේ සිට 2025 සැප්තැම්බර් 26 විගණිත දිනය වනතෙක් සෝලා පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම සූර්යය විදුලි උත්පාදන පද්ධති සවි කිරීමෙන් විදුලි බිල අඩුකර ගැනීම අපේක්ෂාව වී ඇති නමුත් එම අරමුණ ඉටු නොවීම පිලිබඳව ජො.ස.වි. ප්‍රකාශ කරන ලදී.<br>තඹුත්තේගම රෝහලේ සූර්යය විදුලි උත්පාදන පද්ධතිය පුද්ගලික සමාගමක් මගින් සවිකර ඇත්තේ රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරිත්‍යාගයක් යටතේ බව පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන බව ප්‍රධාන ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>සියළුම ආයතනවල online පරීක්ෂාව සිදුකල යුතු බවත් ඒ සඳහා | |

| | | | |
|---|---|---|---|
| | | නිලධාරියෙකු නම්කල යුතු බවත් දන්වන ලදී. | |
| | V. කළමනාකරණ පුහුණු ඒකකය- පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී නොවීම.<br>කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය මඟින් පුහුණු වැඩසටහන් පැවැත්වීමේදී පුහුණුවට සහභාගී කරවීමට අපේක්ෂා කරන ලද නිලධාරීන් සංඛ්‍යාවට වඩා අඩු නිලධාරීන් සංඛ්‍යාවක් එම පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවී තිබීමෙන් මෙම පුහුණු වැඩසටහන් මඟින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණ බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. | පැමිණීම සනාථ කර නොපැමිණෙන නිලධාරීන්ගෙන් අයකිරීමක් සිදුකල යුතු බවත් එය පුහුණු සඳහා නිලධාරීන්ගේ පැමිණීම අධෛර්යමත් නොවන ලෙස සිදු විය යුතු බවත් දන්වන ලදී. | නි.ප්‍ර.ලේ.(පුහුණු) |
| | VI. අතිකාල දීමනා ගෙවීම<br>පළාත් පුහුණු ඒකකයේ හදිසි රාජකාරි අවශ්‍යතාවයක් නොමැතිව සේවකයන්ට ප්‍රතිලාභයක් ලබා දීමේ අරමුණින් අතිකාල වැඩ කිරීම අනුමත කිරීම සහ ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සටහන් කිහිපයක් නොමැතිව අතිකාල ලබා ගැනීම සිදු කර තිබූ බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. (අරක්කැමි සඳහා අතිකාල ලබා දීම) එසේම සභා ලේකම් කාර්යාලයේ 2025 ජූලි සිට සැප්තැම්බර් දක්වා නිලධාරීන් දෙදෙනෙකු සඳහා පැය 312 ½ ක් සඳහා රු. 80,544 ක් ඇඟිලි සළකුණු යන්ත්‍ර මඟින් පැමිණීම පිටවීම සනාථ කර ගැනීමකින් තොරව ගෙවා තිබූ බව ද ප්‍රකාශ කරන ලදී. | සභා ලේකම් කාර්යාලයේ මෙම ගැටළුව දැනට නොමැති බව සභා ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>අතිකාල දීමනා ගෙවීම විධිමත් කළමනාකරණයක් යටතේ සිදු විය යුතු බවත්, ඒ සඳහා අතිකාල ගෙවීම් කරනු ලබන වවුචර්පතෙහි එදිනෙදා සිදු කරන වැඩ සටහන් කර දෛනිකව අනුමත කිරීම සිදු කිරීම වඩාත් සුදුසු ක්‍රමවේදයක් බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කරන ලදී. මෙහිදී අනුමත කිරීම නිලධාරීන් කිහිප දෙනෙකු විසින් සිදුවිය හැකි බවද ප්‍රකාශ කරන ලදී. | පළාත් සභාවේ සියළුම ආයතන ප්‍රධානීන් |
| | **VII. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතු ඉඩම් සඳහා අයිතිය පවරා නොගැනීම. | මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා කැබිනට් තීරණයක් මත බදු ගෙවීමකින් තොරව ඉඩම් බදු අයිතිය ලබා දී ඇති අකාරයට පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ද බදු ගෙවීමකින් තොරව ඉඩම් අයිතිය පවරා ගැනීම සඳහා ඉල්ලීමක් ප්‍රධාන ලේකම් | සාමාන්‍යාධිකාරී, ප.මා.සං.අ./නි.ප්‍ර.ලේ.(පාලන) |

| | | | |
|---|---|---|---|
| | | වෙත ඉදිරිපත් කර ඇති බව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී. | |
| | **VIII. ඉඩම් ලියාපදිංචි මුද්දර ගාස්තු අයකිරීම**<br>උතුරු මැද පළාත් සභාව තුළ ඉඩම් ලියාපදිංචියේදී, වරිපනම් සකස් කර ගැනීමේදී, විදුලිය ජලය ලබා ගැනීමේදී පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාව ලබාගෙන තිබීම අනිවාර්ය කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත නොකිරීම හේතුවෙන් හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුව තිබීම. මතය ප්‍රකාශ කිරීමේදී ඇතැම් ඉඩම්වලට පමණක් සහන ලබා දී තිබීම | මතය අනිවාර්ය කර නොමැති බවත්, කාර්ය මණ්ඩල හිඟය හා ප්‍රමාණවත් වාහන පහසුකම් නොමැති වීමත් පිළිබඳව පළාත් ආදායම් කොමසාරිස් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. පළාතෙන් පිට ලියාපදිංචි කරන ඔප්පුවල මුද්දර ගාස්තු අයවීම් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දෙවන පිටපත පරීක්ෂා කිරීම මගින් ලබා ගන්නා බව ද ප්‍රකාශ කරන ලදී. | පළාත් ආදායම් කොම. |
| | IX. අනුරාධපුර අධ්‍යාපන කලාපයට අයත් ශාන්ත ජෝශප් විද්‍යාලයට 2019 වර්ෂයේදී මධ්‍යම රජයේ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබුණු රු.43,005,000 ක මුදලින් ඉදි කරන ලද පිහිණුම් තටාකයේ වැඩ අවසන් කර 2024 අගෝස්තු 06 වන දින පාසලට භාරදී තිබුණු නමුත් පුහුණුකරුවෙකු නොමැතිවීම නිසා නිශ්කාර්යව පැවතුණි. | 2024 වර්ෂයේදී මෙය පැසැලට භාර දුන් පසු වසරක පමණ කාලයක් භාවිතයට ගෙන ඇති බවත්, පසුව ජලය රැඳීම අඩුවී ඇති බැවින් අළුත්වැඩියාවක් සඳහා කාලයක් ගත වී ඇති බවත්, දැනට එය යථා තත්වයට පත් කර ඇති බව හා පුහුණුකරුවකුද මේ වන විට බඳවා ගෙන ඇති බැවින් ඊලග සතිය වන විට පුහුණු කිරීම් ආරම්භ කරන බව විදුහල්පති විසින් දන්වා ඇති බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී. | ප.අ.අ |

**04.3 පිළිතුරු නොලද විගණන වාර්තා පළාත් අභ්‍යන්තර විගණන හා වමර්ශන දෙපාර්තමේන්තුව**

| අනු අංකය | විගණන වාර්තාවේ අංකය | විගණන වාර්තාවේ නම සහ විගණිත ආයතනය | නිකුත් කරන ලද්දේ කාටද | නිකුත් කරන ලද දිනය |
|---|---|---|---|---|
| 01 | NCP/IA/03/RDHS/17/25-121 | මිලදී ගැනීම් පිළිබඳ පරීක්ෂාව-ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,උ.මැ.ප | 2025.12.16 |
| 02 | NCP/IA/03/RDHS/17/26-12 | කළමනාකරණය හා මූල්‍ය කටයුතු පිළිබද පරීක්ෂාව<br><br>ගල්නෑව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය | - එම - | 2026.02.25 |
| 03 | NCP/IA/03/PDHS/24/25-114 | භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ පරීක්ෂාව - ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය පොළොන්නරුව. | - එම - | 2025.12.16 |

| | | | | |
|---|---|---|---|---|
| 04 | NCP/IA/03/PDHS/24/25-72 | ඖෂධ තොග , ගබඩා හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ පරීක්ෂාව - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වැලිකන්ද | - එම - | 2025.08.06 |
| 05 | NCP/IA/03/PDHS/09/26 | ආයතන පරිපාලන කටයුතු හා ඖෂධ තොග පරීක්ෂාව - සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය (ඇළහැර) | - එම - | 2026.02.03 |
| 06 | NCP/IA/03/RDHS/ 19/25-133 | භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ පරීක්ෂාව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර | - එම - | 2025.12.05 |
| 07 | NCP/IA/03/RDHS/ 19/26-11 | මූල්‍ය හා ආයතන පරිපාලනය පිළිබඳ පරීක්ෂාව රඹෑව ප්‍රාදේශීය රෝහල | - එම - | 2026.02.20 |
| 08 | NCP/IA/04/ID/08/25-144 | ප්‍රධාන නිමි රෙදිපිළි තොග ගබඩාව පිළිබඳ පසුවිපරම් පරීක්ෂාව - පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ, උ.මැ.ප | 2025.12.24 |
| 09 | NCP/IA/EDU/18,26/25-125,126 | වැටුප් ගෙවීම් පිළිබද පරික්ෂාව-කලාප අධ්‍යාපන කාර්යාලය,අනුරාධපුර | - එම - | 2026.02.17 |
| 10 | NCP/IA/EDU/18/26-32 | අ/කැකි/පලා-බුදුගේහින්න මහා විද්‍යායේ ඌන උපයෝජන / නිශ්කාර්ය වත්කම් පිළිබඳ පරීක්ෂාව | - එම - | 2026.03.19 |
| 11 | NCP/IA/04/MICTS/22/26-37 | උතුරු මැද පළාත තුල ව්‍යාපාර නාම (පුද්ගලයින්, ව්‍යාපාර ආයතන) ලියාපදිංචි කිරීම පිළිබද පසු විපරම් පරීක්ෂාව | ලේකම්, පළාත් සමුපකාර අමාත්‍යාංශය, උ.මැ.ප | 2026.04.08 |

**2026 වර්ෂයේ නිකුත් කරන ලද විශේෂ විමර්ශන වාර්තා**

| අනු අංකය | විගණන වාර්තාවේ අංකය | විගණන වාර්තාවේ නම සහ විගණිත ආයතනය | නිකුත් කරන ලද්දේ කාටද | නිකුත් කරන ලද දිනය |
|---|---|---|---|---|
| 01 | NCP/IA/01/CM/26/26-01 | ප්‍රධාන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කල ව්‍යාපෘති 07 කට අදාලව විමර්ශනයන් සිදු කිරීම | ප්‍රධාන ලේකම්, උ.මැ.ප. | 2026.02.12 |
| 02 | NCP/IA/01/EDU/26/26-18 | එප්පාවල රාහුල ප්‍රා.වි.හි 2026 -1 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුලත් කිරීමේදී නීති විරෝධී මුදල් අය කිරීමක් සිදු වී ඇද්ද යන්න පරීක්ෂාව | -එම- | 2026.02.27 |
| 03 | NCP/IA/04/PSD/22/26-10 | ස්වේච්ඡා පුහුණුකරුවන් ලියාපදිංචි කිරීම සහ පුහුණු බලපත්‍රය ලබා දීම 2024-2026 පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව | -එම- | 2026.02.24 |
| 04 | NCP/IA/01/CM/18/26-14 | කේ.බී.රත්නායක විදුහලේ මුදල් අක්‍රමිකතාවය සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාව | -එම- | 2026.02.27 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 05 | NCP/IA/01/CM/18/26-20 | ගණිත කදවුරක සංග්‍රහ වියදම් පාසැල් සංවර්ධන සමිති අරමුදලින් ගෙවීම පිළිබඳ පරීක්ෂාව - බුදුගේහින්න මහ විදුහල | -එම- | 2026.03.16 | | |
| 06 | NCP/IA/03/AYUR/09/26-30 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සිදු වී ඇතැයි කියන අක්‍රමික සහ වංචික ගණුදෙණුවක් සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් කරන ලෙස ඉල්ලීම | -එම- | 2026.05.11 | | |

**2023 සිට 2025 දක්වා නිකුත් කරන ලද විශේෂ විමර්ශන වාර්තා අතුරින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කර ඇති වාර්තා පිළිබඳ විස්තර - මෙම වාර්තා සම්බන්ධයෙන් ඒ ඒ අමාත්‍යාංශ විගණන කමිටුවලදී ප්‍රගතිය සාකච්ඡා කල යුතු බව දන්වන ලදී.**

| විගණන වාර්තාවේ අංකය | විගණන වාර්තාවේ නම සහ විගණිත ආයතනය | නිකුත් කල දිනය හා නිකුත් කළේ කාටද යන්න | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කර ඇති ආයතනය |
|---|---|---|---|
| NCP/IA/01/EDU/17/23-159 | රජයේ මුදල් අවභාවිත කිරීම/ විවිධ දූෂණ අක්‍රමිකතා සිදු කිරීම සබැඳිව විගණනයක් ඉල්ලා සිටීම විදුහල්පති, අ/මාටඹුවා හල්මිල්ලෑව විදුහල | ප්‍රධාන ලේකම්, උ.මැ.ප. | ප්‍රධාන අමාත්‍යාංශය, උ.මැ.ප. |
| NCP/IA/01/DECMA/19/23-44 | වාහන පරිපාලනය පිළිබඳ පරීක්ෂාව - සංවර්ධන, නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | - එම - | - එම - |
| NCP/IA/01/EDU/POLO/09/23-170 | පො/දිඹු අරල/ලීලාරත්න විජේසිංහ මහා විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ මුල්‍ය අක්‍රමිකතා පිළිබඳව වූ පෙත්සම් පරීක්ෂාව | - එම - | - එම - |
| NCP/IA/05/PRDA/14/25-109 | හොරොව්පතාන අලුත්ඔය මාර්ගය නඩත්තු ව්‍යාපෘතියේ කම්කරුවෙකු වූ ඩී.එම්.සිසිර | - එම - | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |

| | | | |
|---|---|---|---|
| | කුමාරගේ වැටුප ව්‍යාජ ලෙස ලබා ගැනීම සම්බන්ධ විමර්ශනය | | |
| NCP/IA/03/PC/19/25-51 | ඉන්ධන වලින් වංචා කිරීම හා රාජ්‍ය දේපල අවභාවිතා කිරීම පිළිබඳ පෙත්සම් පරීක්ෂාව - පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | - එම - | සෞඛ්‍ය අමාත්‍යාංශය, උ.මැ.ප. |
| NCP/IA/03/RDHS/17/25-62 | අයථා මුදල් ඉපයීම සම්බන්ධයෙන් තම්මැන්නාව ප්‍රාදේශීය රෝහලේ ආයතනභාර වෛද්‍ය නිලධාරියාට එරෙහි පෙත්සම් පරීක්ෂාව | - එම - | - එම - |
| NCP/IA/01/EDU/08/25-79 | පොළොන්නරුව අත්තනකඩවල මහා විද්‍යාලයේ පවතින ගැටළුකාරී තත්ත්වයක් පිළිබඳ මහජන නියෝජනයන් පිළිබඳ පරීක්ෂාව | - එම - | ප්‍රධාන අමාත්‍යාංශය, උ.මැ.ප. |
| NCP/IA/01/EDU/14/25-108 | අ/අල්මාස් ම.වි සිදුවූ මුදල් වංචා හා අනෙකුත් වංචා සම්බන්ධවයි | - එම - | - එම - |
| NCP/IA/01/DECMA/08/25-02 | 2024 වසර අවසාන වාර විභාග ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය කිරීම හා බෙදා හැරීමේ ක්‍රියාවලිය පිළිබඳ පරීක්ෂාව, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | - එම - | - එම - |
| NCP/IA/03/RDHS/17/25-99 | තඹුත්තේගම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම පිළිබඳ පරීක්ෂාව | - එම - | සෞඛ්‍ය අමාත්‍යාංශය, උ.මැ.ප. |

| | | | |
|---|---|---|---|
| NCP/IA/03/RDHS/24/25-113 | 01. සෞඛ්‍ය පරිපාලනය මෙහෙයවන සවිනි මැඩම්ගේ හැසිරීම හා වංචා දූෂණ 02. ප්‍රා.සෞ.සේ.අධ්‍යක්ෂ වැඩබලන රියදුරු දෙහිගම යන අය සම්බන්ධව | - එම - | - එම - |
| NCP/IA/01/RDHS/19/25-100 | දූෂිතයන් රකින සෞඛ්‍ය පරිපාලනය යන මැයෙන් ඉදිරිපත් කර ඇති පැමිණිල්ල පිළිබඳ පරික්ෂාව - ප්‍රා.සෞ.සේ.අධ්‍යක්ෂ කාර්යාලය - අනුරාධපුර | - එම - | - එම - |
| NCP/IA/03/RDHS/17/25-132 | ජපන් ඉන්ධන ආධාර ව්‍යාපෘතිය යටතේ ඉන්ධන ලබා දීම පරීක්ෂාව | - එම - | - එම - |
| NCP/IA/04/CO/22/25-112 | සමිතියේ ආදායම ලබන ආයතන සාමාන්‍යාධිකාරී මගින් අත්පත් කර ගැනීම සම්බන්ධව | - එම - | සමූපකාර අමාත්‍යාංශය |
| NCP/IA/01/CS/26/25-86 | ප්‍රශ්ණ පත්‍රවල මුද්‍රණ දෝශ සහගත තත්වයන් සම්බන්ධයෙන් වූ සෝදිසි පරීක්ෂාව | - එම - | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය |

**පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව - 2026 වර්ෂයේ විගණන සැළැස්ම අනුව ප්‍රගතිය - 2026.06.10 දිනට**

1. සේවයේ නිරත මුළු විගණන කාර්ය මණ්ඩලය - 14
2. 2026 වර්ෂයේ විගණනය කිරීමට අපේක්ෂා කල මුළු ආයතන සංඛ්‍යාව - 46
3. නිකුත් කිරීමට අපේක්ෂා කල වාර්තා ගණන (මුළු වර්ෂයටම) - 156
4. 2026.06.10 දිනට නිකුත් කරන ලද වාර්තා සංඛ්‍යාව,
   අභ්‍යන්තර විගණන වාර්තා ගණන - 25

විශේෂ විමර්ශන වාර්තා ගණන - 06

පසු විපරම් වාර්තා - 09 40

5. දැනට සිදු කෙරෙමින් පවතින විගණන හා විමර්ශන සංඛ්‍යාව - 23

අභ්‍යන්තර විගණන සංඛ්‍යාව 18

විමර්ශන සංඛ්‍යාව 05

**විමර්ශනවල ප්‍රගතිය (විමර්ශන 05)**

1. අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් බෙදා හරින ලද ත්‍රිපෝෂ සම්බන්ධ පරීක්ෂාව 2023 ( රාජ්‍ය ගිණුම් කාරක සභා නියෝග)
   - ප්‍රකාශ සටහන් කර ගැනීම අවසන් කර ඇත. වාර්තාව කෙටුම්පත් කරමින් පවතී.
2. පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයේ නිලධාරින්ගේ අවිධිමත් ක්‍රියාකලාපය පිළිබද පෙත්සම් පරීක්ෂාව
   - ප්‍රකාශ සටහන් කර ගැනීම අවසන් කර ඇත. වාර්තාව කෙටුම්පත් කරමින් පවතී.
3. මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ නිලධාරින්ගේ අවිධිමත් ක්‍රියාකලාපය පිළිබද පෙත්සම් පරීක්ෂාව
   - ප්‍රකාශ සටහන් කරගනිමින් පවතී
4. රඹෑව මධ්‍ය විද්‍යාලය හා සංගිලිකනදරාව විදුහලේ ගුරුවරුන් දෙදෙනෙකුගේ වංචා හා දූෂණ සම්බන්ධයෙන් ලැබී ඇති පෙත්සම පිළිබද පරීක්ෂාව
   - පරීක්ෂණය ආරම්භ කර ඇත.
5. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නාස්තිකාර වියදම් නතර කර දෙන ලෙස ඉල්ලා සිටීම පිළිබද වූ පෙත්සම් පරීක්ෂාව -වාර්තාව කෙටුම්පත් කර ඇත.

**විගණන නිලධාරීන් විසින් දැනට සිදු කරමින් පවතින අභ්‍යන්තර විගණනයන්**

1. ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම පිළිබද පරීක්ෂාව- අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
2. ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම පිළිබද පරීක්ෂාව- පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය

3. ත්‍රිපෝෂ සම්බන්ධ පරීක්ෂාවේදී අනාවරණය වූ අභ්‍යන්තර පාලන දුර්වලතා- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය

4. හිඟුරක්ගොඩ මූලික රෝහල විගණන පරීක්ෂාව

5. ආයතන හා පරිපාලන කටයුතු පිළිබඳ පරීක්ෂාව-රාජාංගනය යාය 11 ප්‍රාදේශීය රෝහල

6. ආහාර වියදම් පිළිබද පරීක්ෂාව- පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

7. බරවාහන රියදුරු බලපත්‍රය ලබා දීමේ ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂාව - පළාත් සමුපකාර අමාත්‍යාංශය

8. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ඇති මාර්ගය කාපට් කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂාව.

9. උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක හෙළ බොජුන්හල් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

10. ගොවීන් හා කෘෂි ව්‍යවසායකයන් සඳහා 50% ප්‍රතිලාභ දායකත්වය යටතේ උපකරණ ලබා දීමේ වැඩසටහන සඳහා උපකරණ මිලදී ගැනීම පිළිබඳ පරීක්ෂාව - පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

11. මූලධන ව්‍යාපෘති වල ප්‍රගතිය පරීක්ෂාව - සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, මහඉලුප්පල්ලම

12. මූල්‍ය පරිපාලන කටයුතු පිළිබද පරීකෂාව- කන්දේගම කනිෂ්ඨ විද්‍යාලය

13. ආයතන පරිපාලන කටයුතු පිළිබද පරීකෂාව - කන්දේගම කනිෂ්ඨ විද්‍යාලය

14. පාසල් පෝෂණ ආහාර වැඩසටහන පිළිබද පරීක්ෂාව-සියඹලාගස්වැව මැදගම විදුහල

15. ගෙවීම් වවුචර පරීක්ෂාව- ප්‍රධාන අමාත්‍යාංශය

16. විගණන පරීක්ෂාව - මැදවච්චිය ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය

17. පුහුණු වැඩසටහන් සඳහා ආහාර මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ආහාර සකස් කිරීමේ ක්‍රියාවලිය සහ වියළි ආහාර ද්‍රව්‍ය තොග ගබඩාව පරීක්ෂා කිරීම.

18. GEMP ව්‍යාපෘතිය පිළිබද පරීක්ෂාව, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| | | | |
|---|---|---|---|
| **04.4 පාලිත ආයතනවලට අදාලව පළාත් සභා විගණන හා කළමනාකරණ කමිටු මට්ටමෙන් විසදාගත යුතු කරුණු සාකච්ඡා කිරීම** | | | |
| 1 | ඉන්ධන මිල ඉහල යාම හේතුවෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි වීමේ ගැටළුව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ විගණන කමිටුවේදී ඉදිරිපත් විය. | පවතින ඉන්ධන අර්බුධකාරී තත්වය පහව යනතෙක් පමණක් ඉන්ධන පරීක්ෂාව සිදු නොකිරීම සම්බන්ධයෙන් ගැටළුවක් නොවන බව සාකච්ඡා විය. | සියළු ආයතන ප්‍රධානීන් |
| 2 | නොපිය වූ අග්‍රිම ශේෂ - පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් 2006 වර්ෂයේ සිට පියවිය යුතු රු.1,072,847.62 ක ශේෂයක් පවතින අතර, මෙම මුදල නොපියවීම සම්බන්ධයෙන් නීතිපති වෙත යොමු කර ඇතත් ඒ සදහා පිළිතුරක් ලැබී නොතිබීම.<br>2006 වර්ෂයේ කැබිතිගොල්ලෑව ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් පැරකුම් ගොවි සංවිධානය වෙත මෙම අත්තිකාරම් මුදල ලබා දී ඇත. | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් මු.රෙ.104 පරීක්ෂණයක් සිදුකල යුතු බව දන්වන ලදී. | ලේකම්, ප.කෘෂි.අමා. |
| **04.5 වෙනත් කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම** | | | |
| 1 | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ අංක 250-2084 දරණ කැබ් රථයේ වාමුවාව පළුදුවීමට අදාලව එම පළුදුවීම පැරණි බව සදහන් කරමින් රක්ෂණ හිමිකම් ගෙවීම පීපල්ස් ඉන්ෂුවරන්ස් ආයතනය විසින් සිදු නොකිරීම. | මෙම රථයේ රක්ෂණය අඛණ්ඩව පීපල්ස් ඉන්ෂුවරන්ස් ආයතනය වෙතින් සිදු කර ඇති බැවින්, මෙම නොගෙවීම සම්බන්ධයෙන් රක්ෂණ නියාමන ආයතනයට ලිපියක් යොමු කරන ලෙසත්, එහි පිටපතක් තමා වෙත ලබා දෙන ලෙසත්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී. | ප්‍ර.අ.වි. |
| 2 | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සදහා කමිටු සාමාජිකයන් සහභාගී නොවන අවස්ථා පැවතීම | 2018 අංක 19 දරණ විගණන පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත කමිටුවක් වන බැවින් මෙම කමිටු නිසියාකාරව පැවැත්වීමේ අවශ්‍යතාවය හා ඵලදායීතාවය පිළිබඳ පෙන්වා දෙන ලදී.<br>අමාත්‍යාංශ විගණන කමිටුවලදී සැළසුම් අධ්‍යක්ෂ කමිටුවට ඇතුලත් නොවීම ගැටළු සහගත බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්( සැළසුම්) ප්‍රකාශ කරන ලදී. විගණන කමිටුවේදී සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධ විමසීම්වලදී ගණකාධිකාරී පිළිතුරු ලබා දෙන බැවින් නිවැරදිම පිළිතුර ලබා දෙන්නේද යන්න ගැටළු සහගත බව ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. | සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| | | එය වැරදි අවබෝධයක් බවත්, ගණකාධිකාරී වෙතින් විමසීම් කරන්නේ තාක්ෂණිකව ඔහුට එම හැකියාව පවතින බැවින් යන්න කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කරන ලදී. විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය තීරණය කර ඇත්තේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයක් මගින් බවත්, අමාත්‍යාංශ විගණන කමිටු සදහා සැළසුම් අධ්‍යක්ෂ සහභාගී කරවා ගැනීමට අමාත්‍යාංශ ලේකම්ට හැකියාව පවතින බවත් දන්වන ලදී. | |

**05 අදහස් දැක්වීම**

05.1 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඩී.ඩබ්.එස්.රංජිත් මහතා විසින් අදහස් දක්වමින් විගණන හා කළමනාකරණ කමිටු යනු විගණන පනතින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් බවත්, රාජ්‍ය ගිණුම් කාරක සභා හා රාජ්‍ය ව්‍යාපාර ගිණුම් කාරක සභා විසින් ද මෙම කමිටු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇති බැවින් මෙම විගණන කමිටු හරහා පවතින ගැටළු විසදා ගනු ඇතැයි බලාපොරොත්තු වන බව ද ප්‍රකාශ කරන ලදී. එබැවින් මෙම විගණන හා කළමනාකරණ කමිටුවේදී ගැටළු හැකිතාක් විසදා ගත යුතු බව ද, විසදා ගැනීමට අපහසු වන ගැටළු පමණක් පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේදී එහි ව්‍යවස්ථාපිත බලතල අනුව විසදා ගත යුත යුතු වන  බව ප්‍රකාශ කරන ලදී. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට පැමිණීමේදී අදාල ගැටළු සදහා පිළිතුරු සැපයීමට සූදානම්ව පැමිණිය යුතු බවත්, වාර්තාවේ සදහන් වන්නේ කෙටි සටහනක් පමණක් බැවින් කරුණු පැහැදිලි කර දීමට හැකිවන පරිදි කරුණු අධ්‍යයනය කර පැමිණිය යුතු බවත්, පිළිතුරු ලබා දීමේදී නිශ්චිත කාල වකවානු සහිතව පිළිතුරු ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී. එසේම විගණනයට පිළිතුරු සැපයීමේදී ද නිශ්චිත කාල වකවානු සහිතව පිළිතුරු ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදී. ලබන වසර වන විට සියළුම ගණන්දීමේ නිලධාරීන්ගේ හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ කාර්ය සාධනය මාර්ගගතව(online) ඇගයීමට කටයුතු කරමින් පවතින බවත්, ක්‍රියාකාරී සැළැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා පසුගිය වසරවල පසුවිපරම ද ලබා දිය යුතු බවත්, ඒ අනුව විගණනය පෙන්වා දෙන ව්‍යාපෘතිවල පමණක් නොව පසුගිය වසරවල ක්‍රියාත්මක කල සියළු සංවර්ධන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ඉටුවී ඇත්ද, මගහැරීම් ඇත්නම් ඒ සදහා ගන්නා ක්‍රියාමාර්ග හා නිවැරදි කිරීම් සිදුකර තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. එසේම සංවර්ධන ව්‍යාපෘති හා අනෙකුත් සේවාවල ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඉදිරියට වගකිව හැකි මට්ටමින් තිබිය යුතු බවත්, යම් මට්ටමකට ගන්නා ලද තීන්දු තීරණ නිලධාරීන්ගේ මට්ටමින් ගන්නා බැවින් වෙනත් අයගේ බලපෑමෙන් සිදුකල බව, ප්‍රතිපාදන නොමැති බව හෝ මුදල් නොමැති බව ආදී වශයෙන් කිව නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. එබැවින් නිසි ශක්‍යතා අධ්‍යයනයන් සිදු කර, නීතිමය අවශ්‍යතාවයන් පිළිපදිමින්, නිශ්චිත අරමුණට යා හැකි පරිදි සෑම ව්‍යාපෘතියක්ම සැළසුම් කර ක්‍රියාත්මක කල යුතු බව ද ප්‍රකාශ කරන ලදී. එසේම ප්‍රසම්පාදන සම්බන්ධයෙන් හැකිතාක් නිලධාරීන් පුහුණුකල යුතු බවත්, එසේ පුහුණුව ලද බවට ඔවුන්ගේ පුද්ගලික ලිපි ගොණුවලට ලිපි ඇතුලත් කල යුතු බවත් ප්‍රකාශ කල අතර, පළාත් සභාවේ සියළුම

මාණ්ඩලික නිලධාරීන්ගේ මානව සම්පත් දත්ත ලේඛණයක් (Human resources inventory) නම, තනතුර, අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම්, ලබා ඇති පුහුණුවීම්, විශේෂ හැකියාවන් යනාදී කරුණු ඇතුලත් කර පවත්වා ගැනීම කල යුතු බවත්, ඒ අනුව රාජකාරි පැවරීම් කල හැකි බවත් ප්‍රකාශ කරන ලදී. එපරිදිම සියළුම ආයතනවල, ආයතනයේ නිලධාරීන් සම්බන්ධයෙන් ද මානව සම්පත් දත්ත ලේඛණයක් පවත්වා ගැනීම කල යුතු බව ද ප්‍රකාශ කල අතර, නිවැරදි ආකල්ප, දැනුම, කුසලතා ඇත්නම් නිලධාරීන්ට රාජකාරි කිරීමට නිදහස ඇති බවත් ප්‍රකාශ කරමින්, මුදල් පනත අනුව මුදල් රෙගුලාසි සංශෝධනය වන බවත්, ඒ අනුව ඉදිරියට කටයුතු කල යුතු බවත්, නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අධ්‍යයනය කරන ලෙසත් ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

05.2 ජාතික විගණන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් අදහස් දක්වමින් මෙම කමිටුවේදී සාකච්ජා කල මූලික පරීක්ෂණ හා මු.රෙ.104 පරීක්ෂණවල ප්‍රගතිය ප්‍රධාන ලේකම් හරහා මාසිකව ලබා දෙන ලෙස ඉල්ලීමක් කල අතර, මෙම වසර අවසන් වන විට පරීක්ෂණ සියල්ල අවසන් වනු ඇතැයි බලාපොරොත්තුවන බවද, ස්ථාන මාරු සම්බන්ධයෙන් විවිධ ගැටළු පවතින බව නිරීක්ෂණය වන බැවින් ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව හෝ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ලෙස හෝ නිවැරදිව ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී. 2025 අංක 19 දරණ සංශෝධිත විගණන පනත අනුව කිසියම් ලිඛිත නීතියක් උල්ලංඝණය වී ඇත්නම්, දූෂණයක් සිදු වී ඇත්නම් ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කරන ආයතනයකට පැමිණිල්ලක් යොමු කරන ලෙස ගණන්දීමේ නිලධාරියාට ඉල්ලීමක් කිරීමට විගණනයට හැකියාව පවතින බවත්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා සම්බන්ධයෙන් වන විට අමාත්‍ය මණ්ඩලයේ ලේකම් වෙත එම ඉල්ලීම කල හැකි බව ද ප්‍රකාශ කරන ලදී. වරින් වර එහි ප්‍රගතිය ලබා ගැනීමට විගණනයට හැකි බැවින් ඒ පිළිබදව අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කල අතර, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ප්‍රකාශ කල පරිදි මානව සම්පත් දත්ත ලේඛණයක් පවත්වා ගෙන යාම සුදුසු බවත්, නිළධාරීන් ඇගයීමට කාර්ය සාධන දර්ශක සකස් කිරීමත් සුදුසු බව පෙන්වා දෙමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

05.3 පළාත් භාණ්ඩාගාරයේ නියෝජිත නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) විසින් අදහස් දක්වමින් අද දින විගණන කමිටුවේදී වැදගත් තීන්දු තීරණ කිහිපයක් ගත් බවත්, තවමත් පැරණි කාරණා සාකච්ජා වෙමින් පවතින බවත්, එම කාරණා ද අවසන් කර ගත හැකි වුවහොත් වර්ථමානයේ එකතුවන ගැටළු ප්‍රමාණය අඩු බැවින් යම් පහසුවක් ඇතිවන බවත් ප්‍රකාශ කරන ලදී. එසේම පළාත් අමාත්‍යංශ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයෙකු වශයෙන් තමා එම විගණන කමිටු සදහා පෞද්ගලිකවම සහභාගී වන බවත්, අනෙකත් දෙපාර්තමේන්තු විගණන කමිටු සදහා පළාත් භාණ්ඩාගාර නියෝජිතයෙකු හැකි සෑම අවස්ථාවලදීම සහභාගී වී ඇති බවත් ප්‍රකාශ කරමින් දෙපාර්තමේන්තුවක යම් විගණන කමිටුවක් සදහා විශේෂයෙන් සහභාගී විය යුතු බව අදහස් කරන අවස්ථාවක ඒ පිළිබද තමාව දැනුවත් කරන ලෙසත්, ඉල්ලා සිටිමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

05.4 උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් ජේ.එම්.ආර්.පී.ජයසිංහ මහතා විසින් අද දින රැස්වීම රැස්වීම සවස .05.00 ට පෙර අවසන් කිරීමට හැකි වීම සම්බන්ධයෙන් ද, හිග විගණන විමසුම් සංඛ්‍යාව ක්‍රමයෙන් අවම වෙමින් පැවතීම තුලින් ක්‍රමයෙන් නිවැරදි වන තත්වයක් පෙන්නුම් කිරීම සම්බන්ධයෙන් ද සතුටු වෙන බව ප්‍රකාශ කරන ලදී. එසේම පවතින අධික රාජකාරි ප්‍රමාණය ද, අභ්‍යන්තර පාලනයේ පවතින යම් යම් අඩුපාඩු ද හේතුවෙන් වැරදීම් සිදුවන බැවින්, ආයතන ප්‍රධානීන් ලෙස නිවැරදිව කටයුතු කිරීමෙන් අඩුපාඩු අවම කරගත හැකි බවත්, අද දින සාකච්ජා කල පරිදි කාර්ය

මණ්ඩල හිගකමත්, රාජකාරි වැඩිවීමත් හේතුවෙන් මු.රෙ.පරීක්ෂණ ප්‍රමාදවීම සිදු වුවද යම් ප්‍රගතියක් පෙන්නුම් කරන බවත්. තවදුරටත් එම පරීක්ෂණ අවසන් කර ගැනීමට උත්සාහ කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්තුමාන් විසින් වටිනා කරුණු කිහිපයක් පෙන්වා දුන් බවත්, ඒ සදහා එතුමන්ට විශේෂයෙන් ස්තුතිවන්ත වන බවත්, ජොෂ්ඨ සහකාර විගණකාධිපතිතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු සියළු දෙනාටත් ස්තුතිය පල කරන ලද අතර, විශේෂයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) සහ අඩු කාර්ය මණ්ඩලයක් සමග විශාල වැඩ ප්‍රමාණයක් ඉටු කරන ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත විශේෂ ස්තුතිය පල කරන බව ද ප්‍රකාශ කරමින් විගණන හා කළමනාකරණ කමිටුවේ කටයුතු අවසන් කරන ලදී.

රැස්වීම අවසන් කල වේලාව ප.ව.4.45

**(බී.වී.කේ.බී.බෙනරගම)**

ප්‍රධාන අභ්‍යන්තර විගණක

උතුරු මැද පළාත.